www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනේශ්වරයේ අර්බුදය සහ ඉතිහාසයේ පුනරාගමනය

## The capitalist crisis and the return of history

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2009 මාර්තු 26**

1. ලෝක ධනවාදයේ වත්මන් අර්බුදය, 1930න් මෙපිට ඇති වූ දරුනුම අර්බුදය බවත් එය ධනේශ්වර ක්‍රමයේ ජාත්‍යන්තර යුක්ති යුක්තිභාවයට විනාශකාරී පහරක් එල්ල කොට ඇති බවත් බැරෑරුම් ධනේශ්වර අර්ථශාස්ත්‍රයන් විසින් ම පවා පිලිගනු ලැබ ඇත. දේශපාලකයන් හා මාධ්‍යයන්හි ප්‍රධාන කථකයන් විසින් ද බොහෝ ශාස්ත්‍රාලිකයන් විසින් ද දශක ගනනාවක් තිස්සේ අනභියෝගී සත්‍යය ලෙස පුදනු ලැබූ නිදහස්-වෙලඳ පල පිලිබඳ ගොඩ වෙදකම් බුද්ධිමය වශයෙන් ද සදාචාරාත්මකව ද අපකීර්තියට පත් කරනු ලැබ ඇත. ධනේශ්වර ක්‍රමයට ලැබෙන්නට යන කලදසාව ගැන වැඩෙන සැක සාංකාවක් පැතිරෙමින් පවතී. ද *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ මාර්ටින් වුල්ෆ් මාර්තු 8 දා මෙසේ ලිවීය:

> "මෙවන් සන්ධිස්ථානයක දී අප ගමන් කරමින් සිටින්නේ කොයිබට දැයි දැන ගැනීම කිසිසේත් ම කල හැක්කක් නොවේ... එහෙත් මූල්‍ය බිඳ වැටීමක් ද දැවැන්ත අවපාතයක් ද මෙසේ ඒකාබද්ධ වීම, සහතිකෙන්ම ලෝකය වෙනස් කරනු ඇත:, නැහොත් ඊට වඩා නපුරු විපාක ගෙන දෙනු ඇත. වෙලඳපලේ යුක්තියුක්තිතාව හීනවී යනු ඇත. එක්සත් ජනපදයේ විශ්වසනීයතාවයට හානි වනු ඇත. චීනයේ අධිකාරය වැඩෙනු ඇත. මේ වනාහී මහ කලබැගෑනි සහගත තත්වයකි.

2. තවත් ලිපියක ද *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පත මෙරිල් ලින්ච් සමාගමේ මොස්කව් කලමනාකාර බර්නික්ස් සුමර්ගේ පහත සඳහන් ප්‍රකාශය උපුටා දක්වයි.

> "අපගේ ලෝකය බිඳ වැටී තිබේ. ඇත්තටම ඒ වෙනුවට අලුතින් එන්නේ කුමක් දැයි මා අවංකව ම දන්නේ නැත. ඇමරිකානුවන් ලෙස අපව දක්කන ලද මාලිමාව අහෝසි වී තිබේ. මා මේ සමාන දෙයක් මීට පෙර දැක තිබෙන්නේ, මංමුලාව හා පාඩුව පිලිබඳ හැඟීම් වශයෙන් ගත් විට, සෝවියට් සංගමය බිඳ වැටුනු කල්හි රුසියාවේ මගේ මිත්‍රයන් අතර ය."

### අර්ථකථනයට අසමත්වීම

3. පාලක පන්තිය තුල සහ එහි දේශපාලන සංස්ථාපිතය ඇතුලත දැන් සිදුවෙමින් පවත්නා විවාදය සංකේන්ද්‍රනය වී පවතින්නේ, පද්ධතිය ගලවා ගත හැක්කේ කෙසේද යන්න තුල ය. එහෙත් තත්වයේ බැරෑරුම් භාවය ඉමහත් වුව ද මෙම අර්බුදයේ ඓතිහාසික හා ආර්ථික උල්පත් වටහා ගනු ලැබ නැත. අවමුඛ උගස්කර අංශය ඇතුලතින් පුපුරා බිඳ වැටීම සහ වානිජ වෙලඳ පල ඇන හිටීම, බැංකු පද්ධතිය ද ලෝක ආර්ථිකය ද දන ගැස්සූ අර්බුදයේ වැදගත් සංරචකයන් බව පුලුල්ව වටහා ගනු ලැබ තිබේ. එහෙත් අර්බුදයේ මෙම අංගයන් පිලිබඳව සඳහන් කල පමනින් එම ප්‍රපංචය එසේ වර්ධනය වූයේ කෙසේද, මන්ද, යනාදිය පිලිබඳව කරුනු පැහැදිලි කිරීමක් අපට ලබා ගත නොහැකිය. මෑතක දී *"ද වෝල් ස්ට්‍රීට් ජර්නල්"* සඟරාව අර්බුදයේ මූල හේතුව වන්නේ, "නය ගෙවීම් පැහැරහැරීම සහ පුහු වී ගිය වත්කම්" යයි කියා සිටියේ ය. මෙය වනාහී වක්‍රාලාපයක් හේතු දැක්මක් ලෙස හුවා දැක්වීමට දැරෙන්නා වූ උත්සාහයකි. "නය ගෙවීම් පැහැරහැරීම" ද "වත්කම් පුහුවී යාම" ද අර්බුදයේ ප්‍රකාශනයන් මිස "හේතු නොවේ." ඇත්ත වශයෙන්ම හේතුව පැහැදිලි කල යුතුව ඇත.

4. අර්බුදයේ උල්පත් පිලිබඳ බැරෑරුම් එලිදරව් කිරීමක්, - එනම් වර්තමාන තත්වය විස්තර කිරීමෙන් ඔබ්බට යන අර්ථකථනයන්, සහ දිග හැරෙන ව්‍යසනයේ ආසන්න හේතු වලින් ඔබ්බට අනන්‍ය කරගැනීම දක්වා දිවෙන හේතු - ඔවුන් අත නැත්තේ මන්ද යන්නට ඉතා නිශ්චිත හේතු පවතී. ඔවුන් අසමත් වීමට ප්‍රථම හේතුව නම් ධනේශ්වර ක්‍රමයේ, විශේෂයෙන්ම ඇමරිකාවේ, අති මූලික ප්‍රානශක්‍යතාවය ද එහි ඓතිහාසික වෙනස් නොවන සුලු බව ද ප්‍රශ්නයට භාජනය කල නොහැකිය යන විශ්වාසයයි. ඉහතින් සඳහන් කරන ලද ලිපිය තුල මාටින් වොල්ෆ් නොසඟවා ම ප්‍රකාශ කර සිටින පරිදි ''වෙලඳපොල ආර්ථිකයට එරෙහිව වෙනත් විශ්වසනීය ආර්ථික විකල්පයක් ඇත්තේ නැත.'' වොල්ෆ් වැනි වඩාත් සිතන මතන ආර්ථික විශේෂඥයන් විසින් පවා දරනු ලබන

මෙම මතය තවත් සංකල්පයක් ද සමග බැඳී පවතී. එය නම් මෙම අර්බුදයේ හේතුව පවතින්නේ පද්ධතියෙන් පිටස්තරව බවය. අර්බුදයේ හේතුව පවතින්නේ ලාභ ගරන පද්ධතියේ සාරභූත ස්වභාවය තුල නොව න බවය. ඒ වෙනුවට මූල හේතු සොයාගත යුත්තේ එම පද්ධතිය වර්තමානයේ ක්‍රියාත්මක වන වාතාවරනය තුල බවය.

5. එවන් මතු පිටට සීමා වූ නොගැඹුරු දැක්මක් ප්‍රතික්ෂේප කරන මාක්ස්වාදය, වත්මන් අර්බුදය වනාහී ධනේශ්වර නිෂ්පාදන මාධ්‍යයේ ඩීඑන්ඒ (DNA) තුල ආවේනිකව පවත්නේ යයි කිව යුතු ප්‍රතිසතිතාවන්ගේ අනිවාර්ය ප්‍රතිඵලය බව පෙන්නුම් කර දෙයි. අර්බුදය හා බිඳ වැටීම කරා අනිවාර්යයෙන්ම මග පාදන්නා වූ ආර්ථික ප්‍රතිසතිතාවන් ප්‍රතික්ෂේප කරන ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයෝ මෙයට ප්‍රතිසන්දනීයව ධනවාදය කෙරේ ක්ෂමාලාපී ප්‍රවිෂ්ටයක් ගනිති. මාක්ස් මෙසේ පැහැදිලි කලේ යඃ

> "අර්බුදයක් පවතින්නේ මෙම ප්‍රතිසතිතාවන් පවතින හෙයිනි. ඔවුන් (එනම්, ධනේශ්වර ක්ෂමාලාපකයන් ) අර්බුදයට එරෙහිව ඉදිරිපත් කරන සෑම ප්‍රතිසතිතාවක් ම බහිෂ්කෘත ප්‍රතිසතිතාවකි. (ඔවුන් විසින් මෙසේ බැහැර කරනු ලැබ ඇත්තේ ) ඇත්ත වශයෙන්ම සැබෑ ප්‍රතිසතිතාවකි. (ධනේශ්වර ක්‍රමයට ආවේනික වූ සැබෑ ) ප්‍රතිසතිතාවන් නොපවත්නේ යයි තමන්ව ම ඒත්තු ගන්වා ගැනීමට පවත්නා මේ අවශ්‍යතාවය වනාහී ඇත්ත වශයෙන්ම පවත්නා එම ප්‍රතිසතිතාවන් නොපැවතිය යුතු යැයි කෙරෙන භක්තිමත් ප්‍රාර්ථනයයි.'' තියරීස් ඔෆ් සර්ප්ලස් වැලිව්- දෙවැනි පොත -පිටු 519. කාල් මාක්ස්)

6. ප්‍රතිසතිතාවන් බහිෂ්කරනයට දැරෙන ප්‍රයත්නය පහත සඳහන් රූපය අත් කර ගනී. මාධ්‍යයන්හි ඉදිරිපත් කැරෙන පරිදි ධනේශ්වර ක්‍රමය නානාප්‍රකාර, පැහැදිලිව ම හඳුනා නොගත් දෝෂයන්ට හා අතුරු ආන්තරාවල ප්‍රහාරය ට ලක් වූ ගොදුරකි. ඒවා නම්, ඉවබව නැති සමපේක්ෂනය, මනාව පාලනය නොකෙරුනු බැංකු , පමන ඉක්මවා දිග් ගැස්සුනු රක්ෂන අරමුදල්, මහ පඩි කන මසුරු විධායක නිලධාරීන් පමනක් නොව උවමනාවට වඩා ආත්ම තෘප්තිය සොයන ඇමරිකානු පාරිභෝගිකයන් ය. ඇමරිකාවේ ප්‍රධාන විධායකයා ලෙස පත්වූ දක්ෂ පක්ෂ ඔබාමා මහත්මයා තම මංගල දේශනයේ දී මෙවන් අය සැරවැර දෝෂ දර්ශනයකට ලක් කලේ ය. ඉහත දැක්වුනු සියලුම ''හේතුදැක්වීම්'' වලට පොදු වූ දෙයක් තිබේ. එය නම්, ඒවා අර්බුදය විග්‍රහ කරන්නේ සාරභූත වශයෙන් ම ආත්මීය පදවලින් වීමයි. එනම් එය පැන නැගී ඇත්තේ විවිධ වැරදි හා අත් වැරදි නිසා බවත්, එක්සත් ජනපදය ඇතුලත ද ජාත්‍යන්තරව ද ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික වර්ධනයේ ගැඹුරින්ම මුල් බැසගත්තා වූ වෛෂයික ප්‍රතිසතිතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස නොවන බවත් ය.

7. මේ අනුව, උදාහරනයක් හැටියට, මූල්‍ය වෙලඳපොලවල කලබැගෑනිය විවිධ නය වෙලඳපොලවල අපයෝජනවල ප්‍රතිඵලයක් ලෙස අර්ථකථනය කරනු ලැබේ. මෙහි ලා මුල් තැන දෙනු ලබන්නේ ගෙවා ගැනීමට නොහැකි වූ අය ට නාස්තිකාර ලෙස දිගට හරහට උකස් නය ලබා දීමටය. මෙය සිදුවූයේ මන්ද, විශේෂයෙන්ම ඩොලර් බිලියන සිය ගනන්වල ප්‍රමානයෙන් එසේ සිදුවූයේ මන්ද යන්න පැහැදිලි කරනු නොලැබේ.

## "ඉතිහාසයේ අවසානය" ද?

8. මෙහි ලා අප විසින් අවධානය යොමු නොකර බැරි කාරනයක් නම් අවුරුදු 20 කට පෙර නැගෙනහිර යුරෝපයේ හා සෝවියට් සංගමයේ පුපුරා ගිය අර්බුදය මොවුන් විසින් විග්‍රහ කරන ලද ආකාරයත්, දැන් වත්මන් ලෝක අර්බුදය විග්‍රහ කැරෙන ආකාරයත් අතර පවත්නා කුතුහල ජනක බුද්ධිමය දෙබිඩි ප්‍රමිතියයි.

1989 සමයේ දී ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ ආර්ථික අර්බුදය සමාජවාදයේ සමස්ථ ආසාර්ථකත්වය විදහා දැක්වී ය යන්න සික පදයක් සේ අදහමින් කරගසාගන්නා ලදී. 1991 දී සෝවයට් සංගමය විසිරුවා හැරීම වනාහී සමාජවාදය ආර්ථික වශයෙන් පවත්වාගෙන යා නොහැකි ක්‍රමයක් බවත් මෙතැන් පටන් කිසිදු සිහි බුද්ධිය ඇති, පුද්ගලයෙකුට ධනවාදය වෙනුවට විකල්පයක් ගැන සිතීම පවා කල නොහැකි බවත් යයි නිවේදනය කරන ලදී. ෆ්‍රැන්සිස් ෆුකුයාමා විසින් ''ඉතිහාසයේ අවසානය'' (End of History) යනුවෙන් ජනප්‍රිය කරන ලද පාඨයකින් නම් කරන ලද අවධියකට මානව වර්ගයා එලඹ ඇති බවත් ප්‍රකාශයට පත් කරන ලදී.

9. අනාගතයේ දී ''සිද්ධීන්'' කිසිවක් හෝ සිදුවනු නැතැයි ෆුකුයාමා කියා සිටියේ නැත. ඒ වෙනුවට ඔහු ගේ සංකල්පය වූ 'ඉතිහාසයේ සමාප්තිය' පෙන්නුම් කලේ සමාජ ආර්ථික සංවිධාන ක්‍රමයක් ලෙස ගත් කල්හි ඓතිහාසික ප්‍රගමනයේ ගමනාන්තය ධනවාදය විසින් නියෝජනය කරනු ලැබීය යන්න ය. ඔහුගේ කෘතිය ප්‍රකාශයට පත් කලේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්හි බිඳ වැටීම ද සමග ඇමරිකානු හා ජාත්‍යන්තර ධනේශ්වර පාලක පන්තීන් අලලා හමා ගිය විජයග්‍රහන වාදය යි. ධනවාදයේ ප්‍රසාරනය සඳහා පැනවී පැවැති සකල සීමාවන් ම - භූගෝලීය පමනක් නොව ඓතිහාසික ද - ඉවතට අතුගා දමන ලදී. එහෙත් දැන් අපි ඔවුන්ගේ දෙබිඩි ප්‍රමිතියට එලඹෙමු. සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ අර්බුදය සලකුනු කලේ සමාජවාදයේ අසාර්ථකත්වය නම් (මෙම තන්ත්‍රයන්ගේ සමාජවාදයට සතුරු ස්වභාවය පසෙක තැබුවත්)

ඇමරිකානු හා ලෝක ආර්ථිකයේ වත්මන් අර්බුදය ධනේශ්වර පද්ධතියේ අර්බුදයක් හා අසාර්ථකත්වයක් ලෙස අර්ථ නොදක්වන්නේ කුමක් නිසා ද?

10. සීතල යුද සමයේ සිය එදිරිවාදියා මතින් ලත් දේශපාලන ජයග්‍රහනයෙන් මත්මත්ව පාවී ගිය ඇමරිකානු පාලක පන්තිය, තමන් සර්වබලධාරී යයි සිතා ගත්හ. මෙම මිත්‍යාව ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ අභාවයේ ''මූල සාධක'' පිලිබඳ සාවද්‍ය අගැයීමක් මත පමනක් නොව, ඇමරිකානු ධනවාදයේ ප්‍රතිවිරෝධයන් ආත්ම වංචනිකව ප්‍රතික්ෂේප කිරීම, විශේෂයෙන්ම ලෝක ධනවාදය තුල ඇමරිකානු එක්සත් ජනපදයේ පිරිහී යන තත්වය, මත ද පදනම් විය. ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය වටහා ගැනීමට අසමත්වූ හෝ සමහරවිට නොතකාහැරීමට ඇලුම් කලේ, ස්ටැලින්වාදී තන්ත්‍රයන්ට වලකැපූ, ස්වභාවයෙන් ගෝලීයවූ හා ජාතික රාජ්‍යයන් මත එන්ට එන්ටම ඒකාග්‍රවූ ආර්ථිකයේ හා, ප්‍රතිරෝධය නොපෑහැකි ගෝලීය පීඩනයෙන් ගලා ආ එම ආර්ථික බලවේගයන්ම, එක්සත් ජනපදයේ ඔරොත්තු දීමේ හැකියාව නැති කර එය දුබල කලේය යන්නයි.

11. ස්ටැලින්වාදී තන්ත්‍රයන් විසිරුවා හැරීම මගින් නිර්මානය කරන ලද වාසිදායක භූ දේශපාලනික තත්වයන් කෙටි කාලීනව ඇමරිකා එක්සත් ජනපදය විසින් තම මූලෝපායික ආසක්තයන් ඉදිරියට ගෙන යාම සඳහා පාවිච්චි කරන ලදී. කෙසේ වෙතත් ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීම, 1989-91 වන විටත් දිගු කලක් තිස්සේ පැවතීගෙන ගොස් තිබුනු එක්සත් ජනපදයේ පිරිහීම ආපසු කැරකුවේ නැත. ''ඉතිහාසයේ අවසානය'' පිලිබඳ එකල පැවති කයිකතන්දර තිබිය දී ම, එක්සත් ජනපදය සිය ආර්ථික අත්තිවාරම් ඛාදනය කරමින් තිබුනු ඓතිහාසික වශයෙන් වර්ධනයවී, උග්‍රව පැවති ප්‍රතිසතිතාවන්ගෙන් ගැලැවී ගත්තේ නැත.

## අර්බුදයේ ඓතිහාසික සන්දර්භය

12. අනාගතයේ දී ආපසු හැරී බලන කල්හි, 2008 මහා බිඳවැටීම පෙනීයනු ඇත්තේ 1. එක්සත් ජනපදයේ භූගෝලීය තත්වයේ දශක ගනනාවක් පුරා දිග් ගැසුනු දිරාපත් වීමේ ද, බිඳ වැටීමේ ද 2. සමස්ත ධනේශ්වර පද්ධතිමය අර්බුදයේ හා එක්සත් ජනපදයේ මෙන්ම ජාත්‍යන්තරව ද පන්ති අරගලයේ නව කාල පරිච්ඡේදයක ආරම්භය ද ලෙස ය.

13. 20 වන ශතවර්ෂයේ ලෝක ධනේශ්වර පද්ධතිය තුල තීරනාත්මක භූමිකාව ඉටු කලේ ඇමරිකා එක්සත් ජනපදය යි. පලමු ලෝක යුද්ධය අවසන් වන විට එක්සත් ජනපදය ලෝකයේ කාර්මික බලාගාරය බවට පත්ව තිබුනි. කර්මාන්ත ක්ෂේත්‍රයේ, අධිපති තැනකට ඇමරිකානු සංගතයෝ පත්ව සිටියහ. එහෙත් එක්සත් ජනපදයේ මෙම වර්ධනය තිබිය දී ම, 1914 ප්‍රථම ලෝක යුද්ධය පුපුරා යාම 30 වසරක භූගෝලීය අර්බුදයේ හා අස්ථාවරත්වයේ කාලපරිච්ඡේදයක ආරම්භය සලකුනු කලේ ය.

14. පලමුවන ලෝක යුද්ධයේ පුපුරා යාම, යුරෝපයේ පමනක් නොව ඉක්මනින්ම පෙනීගිය පරිදි, ලෝක ධනවාදයේ ආර්ථික දේශපාලන හා සමාජ සමතුලිතතාව කුඩු කර දැමීය. රුසියානු විප්ලවය ද 1917 ඔක්තෝබරයේ දී බොල්ශෙවික්වරුන් බලයට පත්වීම ද වෛෂයික අර්බුදයේ විප්ලවවාදී ගම්‍යයන් එලිදරව් කලේ ය. 1918 නොවැම්බරයේ දී ජර්මනියේ ඇති වූ විප්ලවවාදී පිපිරීම ලෝක යුද්ධය අවසානයකට ගෙන ආවේ ය. ඉක්බිති දැවුරුද්ද ආර්ථික විපර්යාසයෙන් ද විප්ලවීය කලිකලහයෙන් ද යුරෝපය සොලවා දැමීය. එහෙත් අත්දැකීම් සහගත විප්ලවවදී නායකත්වයක් නොපැවතීම මෙම විපර්යාසයෙන් ගැලැවී පන රැකගෙන එක්තරා ප්‍රමානයක ස්ථාවරත්වයක් තහවුරු කර ගැනීමට යුරෝපීය ධනේශ්වරයට ඉඩකඩ ලබා දුනි.

15. එහෙත් 1920 ගනන්වල මැද, කෙටි හා කලහකාරී ආර්ථික පුනර්ජීවය ද ප්‍රසාරනය ද 1929 ඔක්තෝබරයේ දී වෝල් වීදියේ ඇරැඹුනු විනාශකාරී ආර්ථික බිඳ වැටීමට ඉක්මනින්ම මග පෑදීය. ජනාධිපති රූස්වෙල්ට්ගේ ''නිව් ඩීල්'' (නව ගතමනා) අත්හදාබැලීම් කෙතරම් තිබුන ද ඇමරිකානු ධනේශ්වරයේ නිපුන නායකයෙකු වුව ද ඔහුට මහා ආර්ථික අවපාතය අවසන් කර ලීමට නොහැකි විය. 1930 ගනන්වල දී විරැකියාව දැවැන්ත මට්ටම්වලට ඉහල නැංගේ ය. දිගු තැතකින් පසු ධනපති පන්තියට යලිත් ආර්ථික පුනර්ජීවනයක් ඇතිකර ගත හැකි වූයේ, 1941 දෙසැම්බරයේ දී එක්සත් ජනපදය යුද්ධයට ඇතුලුවීම ද යුද නිෂ්පාදනය උදෙසා ආන්ඩුව කල මහා පරිමාන වියදම් ද සමග ය.

## පශ්චාත්-යුද්ධ පර්යාය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ආධිපත්‍යය

16. යුද්ධය විසින් ඇතිකරන ලද මහා විනාශය, දිගු කාලීන ධනේශ්වර ආර්ථික සමතුලනයක් උදෙසා අවශ්‍යව පැවැති නව පද්ධතිමය සමතුලිතය නිර්මානය කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ කොන්දේසි නිර්මානය කලේ, ඛේදජනක උත්ප්‍රාසයක් සහිතව ය. මෙම ස්ථායී කරනය රැඳී පැවැත්තේ එක්සත් ජනපදයේ මූල්‍ය හා කාර්මික සම්පත් මත ය. යුරෝපයේ හා ජපානයේ සමාජ විප්ලවය පැන නගිතැයි බියට පත් ඇමරිකානු පාලක පන්තිය ලෝක ධනේශ්වරයේ ආර්ථික ප්‍රතිනිර්මානය සංවිධානය කලේ ය. මෙම ප්‍රතිනිර්මානයේ මූලික ව්‍යුහයන් හා යාන්ත්‍රනයන් සූත්‍රගත කරන ලද්දේ 1944 අගෝස්තු මස පැවති බ්‍රෙට්න් වුඩ්ස් සම්මේලනයේ දී ය.

17. නව ගෝලීය ආර්ථික ව්‍යුහයේ ඉතා වැදගත් අංගය වූයේ, එක්සත් ජනපද ඩොලරයේ ආධිපත්‍යය

සහිත ජාත්‍යන්තර මූල්‍ය ව්‍යුහයකි. මෙම පද්ධතිය තුළ එක්සත් ජනපදයෙන් පිටස්තර අන් සියලු මුදල්වල මිල නියම කරන ලද්දේ ඩොලරයට අනුපාතිකව ය. රත්රන් අවුන්සයකට ඩොලර් 35ක් වශයෙන් හුවමාරු කරගත හැකි යයි නියම කිරීම මගින් ඩොලරය රන්වලට ගැටගසන ලදී. මේ අනුව ඩොලරයට ලෝක සංචිත මුදල ලෙස කටයුතු කල හැකි විය. ජාත්‍යන්තර වෙලඳමේ මිල මිල නියම කරන ලද්දේ ඩොලර්වලිනි. එනම් ජාත්‍යන්තර වානිජ සහ මූල්‍ය ගනුදෙනු පියවීම ඩොලර් වලින් සිදුකෙරේ. එක්සත් ජනපදයෙන් පිටස්තර රටවල් ඩොලර් අත තබාගනු ඇති අතර මෙම ඩොලර් තම ජාත්‍යන්තර වානිජ ගනුදෙනු සඳහා යොදාගනු ඇත. ඉල්ලා සිටින ලද කල්හි ඩොලර් 35කට රත්රන් අවුන්සයක් සපයන බවට ඇමරිකාව සහතික වීම මත, ඇමරිකානු මුදලේ ස්ථාවරත්වය පවත්වාගන්නා ලදී.

18. දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිති සමයේ පැවැති තත්වයන් අනුව, ඉහත සඳහන් සහතිකය පවත්වාගෙන යාමට එක්සත් ජනපදයට හැකි දැයි සැකයක් පැවැතුනේ නැත. එවකට ලෝකයේ සිටි අනභියෝගී ආර්ථික හා මූල්‍ය බලවතා වූයේ ඇමරිකා එක්සත් ජනපදය යි. 1952 දී සියලු දියුනු ධනේශ්වර රටවල්වල සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 60ක් පමන පැවැතුනේ එක්සත් ජනපදයේ ය. ඒක ජනක පදනමකින් ගත් කල්හි එක්සත් ජනපදයේ සමස්ත ආර්ථික නිෂ්පාදනය, එක්සත් රාජධානිය සහ ප්‍රංශය යන දෙරටේ ආර්ථික නිෂ්පාදනය මෙන් දෙගුනයක් පමන වූ අතර ජර්මනියේ මෙන් තුන් ගුනයක් ද ඉතාලියේ මෙන් සිව් ගුනයක් ද විය. 1957 තරම් මෑත දී ලෝකයේ ලොකුම සමාගම් 50 අතුරෙන් 43ක් ම පැවැතුනේ එක්සත් ජනපදයේ ය. යුරෝපීය රටවල ද ජපානයේ ද ආර්ථිකයන් අලුතින් ගොඩ නැගීමට මූල්‍ය සම්පාදනය කරන අතරතුරේ ම, සැලකියයුතු වානිජ හා ගෙවුම් ශේෂ අතිරික්ත පවත්වාගෙන යාමට එක්සත් ජනපදයට පැවැති හැකියාව තුලින් එම රටේ අධිපති තත්වය ප්‍රකාශිත විය.

## එක්සත් ජනපද ආර්ථික පරිහානියේ ආරම්භය

19. යුරෝපීය හා ජපාන කර්මාන්ත යලි ඉස්මත්තට ඒම තුලින් ඇමරිකානු ආධිපත්‍යයට යටි වල කැපීමත් සමඟ, ලෝක ධනේශ්වර පද්ධතිය එන්න එන්නම උග්‍රවන්නා වූ ආතතියකට ලක් වීම වැලැක්විය හැක්කක් නොවීය. 1950 ගනන්වල අග වන විට රොබට් ට්‍රිෆින් වැනි අර්ථශාස්ත්‍රඥයෝ එක්සත් ජනපද ගෙවුම් තුලනය නරක අතට හැරී යාම පිලිබඳව තම කනස්සල්ල ප්‍රකාශ කරන්නට පටන් ගත්හ. ගෙවුම් තුලනයේ ඩොලර් හිඟයක් ඇති වුවහොත් එය එක්සත් ජනපදයට ඩොලර් මුදල්වල රන් සංචිතය (ඩොලර් සඳහා රන් සැපැයීමට හැකියාවක් පවතීද යන්න ) ප්‍රශ්නයට භාජන කරනු ඇතැයි ඔහු අනතුරු හැඟවීය. 1971 අගෝස්තු 15 දා ජනාධිපති නික්සන්, හිටි අඩියේ, ඩොලර් රන්වලට හුවමාරු කිරීම නවත්වාලීමත් සමඟ මෙය සනාථ විය. මෙම ක්‍රියාව ධනවාදයේ පශ්චාත් දෙවන ලෝක යුද්ධ ඉතිහාසයේ තීරනාත්මක සන්ධිස්ථානයක් නියෝජනය කරමින් ගෝලීය ධනවාදයේ පශ්චාත්-යුද්ධ කාලීන ප්‍රසාරනය ශක්‍ය කලා වූ මූල්‍ය සමතුලනය බිඳ දැමීය. 1971 අගෝස්තුවලින් ඉක්බිත්තේ එන්න එන්නම ඉහල නැඟි අස්ථාවරකාරී කම්පනයන්ට ලෝක ධනවාදය විවෘත විය. ඇත්ත වශයෙන් ම මා දැනටම පැහැදිලි කර ඇති පරිදි, වත්මන් අර්බුදය අංශ ගනනාවකින්ම ගතවූ 37 වසර පුරා පැවැතීගෙන ආ අසමතුලනයේ සන්තතිය මස්තකප්‍රාප්ත වීමකි.

20. ඩොලර් -රන් පරිවර්ත්‍යතාවේ ද ස්ථාවර හුවමාරු අනුපාතික පද්ධතියේ ද බිඳවැටීම, ගෝලීය ආර්ථිකය තුල ඇමරිකා එක්සත් ජනපදයේ තත්වය පිරිහීයාම යස රඟට ප්‍රකාශිත කිරීමක් වූයේ ය. මෙම පිරිහීමේ දුරදිග යන සුලු විපාක පිලිබඳව ද විශේෂයෙන්ම ඇමරිකානු ධනවාදයේ අර්බුදය අත් කර ගත් සුවිශේෂ රූපාකාරයට (එනම් සමපේක්ෂනයෙන් දුවවනු ලබන බුබුලු මාලාව සහ මූල්‍ය බිඳවැටීම් මාලාවට) එහි පවත්නා සම්බන්ධතාව පිලිබඳව ද නිවැරදි වැටහීමක් අත්කර ගැනීමට නම් ගතවූ වර්ෂ 45 ඇතුලත ඇමරිකානු මහා සංගතයන්හි ඇතිවූ අර්ථභාරී වෙනස්කම් කෙරේ අවධානය යොමු කල යුතුව තිබේ.

## එක්සත් ජනපදයේ මහා සංගතයන් මත ආර්ථික අර්බුදයේ බලපෑම

21. 20 වන ශස වර්ෂයේ ආරම්භක වර්ෂවල දී ඇමරිකානු ධනවාදය ඇති කර ගත් නවීකරනයන් අතර, කාර්මික සංගතය නිර්මානය කිරීම අර්ථභාරී ය. ආර්ථික සංවිධානයේ මෙම නව රූපය වනාහී දුම්රිය මාර්ග, දුම් නැව් සහ දුරකථන පනිවුඩ ක්‍රම වැනි සංනිවේදන සහ ප්‍රවාහන තාක්ෂනයන් කෙරෙහි දක්වන ලද ප්‍රතිචාරයකි. ඇමරිකානු ව්‍යවසායන් පිලිබඳ දීප්තිමත් ඉතිහාසඥයෙකු වූ බනිෂ්ඨ ඇල්ෆ්‍රඩ් චැන්ඩ්ලර් තම ස්කේල් ඇන්ඩ් ස්කෝප්: ද ඩයිනමික්ස් ඔෆ් ඉන්ඩස්ට්‍රියල් කැපිටලිසම් (හාවර්ඩ් යුනිවසිටි ප්‍රෙස්, 1990) නම් කෘතියේ දී පැහැදිලි කල පරිදි,

> ''දුම්රිය සහ විදුලි පනිවුඩ පද්ධතීන් ගොඩ නැගීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නව වර්ගයක වානිජ ව්‍යවසායක් අවශ්‍ය වී තිබුනි. මෙම පද්ධතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දැවැන්ත ආයෝජනයන් ද, ඒවා ක්‍රියාත්මක කිරීමේ සංකීර්නතාවන් ද, අයිතිය හා ක්‍රියාත්මක කිරීම වෙන්කර දැමී ය. බෙහෙවින් විශාල වූ ව්‍යවසායන් දැන් භාරවූයේ සමාගම තුල ආයෝජන අඩු හෝ නැත්තටම නැති පඩි ලබන කලමනාකරුවන් අතට ය. නිරන්තරව මහා

පරිමානයෙන් භාන්ඩ, මගීන් සහ පනිවිඩ ප්‍රවාහය පවත්වාගෙන යෑමේ කෝටි සංඛ්‍යාත තීන්දු මාලාව ගැනීම සඳහා අවශ්‍ය වූ අත්දැකීම හා ඥානය අයිතිකරුවන්ට, එනම් තැනින් තැන විසිරී සිටි ආයෝජකයන්ට තිබුනේ නැත. දුම්රිය මාර්ගයක් හෝ විදුලි පනිවුඩ පද්ධතියක් පවත්වාගෙන යාම දහස් ගනන් කොටස් අයිතිකරුවන් විසින් කල හැක්කක් වූයේ නැත.

22. කර්මාන්තයෙන් කර්මාන්තයට ලියවිලි සහිතව කරුනු ඉදිරිපත් කරන චැන්ඩ්ලර්ගේ අධ්‍යයනයයේ ප්‍රමුඛ තේමාවක් වන්නේ, 20 වන ශතවර්ෂයේ මුල් දශකයන්හිදී එන්ට එන්ට ම, අයිතිය කලමනාකරනයෙන් වෙන්කර දැමීමයි. බොහෝ අවස්ථාවල දී මුලුමහත් කර්මාන්තයන් හි විශාල අංශ අයිතිකරගෙන සිටි බලගතු ධනපති හවුල්කරුවන්ගේ ප්‍රතිපත්ති මත, දිනපතා සෘජු බලපෑමක් ඇතිකලෝ නම් ඒ, අයිතිකරුවන් පුද්ගලිකව ම වෘත්තීය කලමනාකාරක මන්ඩලවල සාමාජිකයන් වූ තාක් දුරට, ඒ ප්‍රමානයට ය. ඇමරිකානු කර්මාන්තවල සැලකිය යුතු කොටසක් කලමනාකරනය කරනු ලැබුවේ, චැන්ඩ්ලර් සඳහන් කල පරිදි, තමන් පාලනය කල සමාගම්වල කොටස්වලින් සියයට එකකට නොවැඩි ප්‍රමානයක් හිමිව සිටි කලමනාකරුවන් විසින් ය. ඔහු මෙසේ ලිවීය:

> ...මෙම පඩි ලබන කලමනාකරුවෝ, විශාල කොටස් අයිතිකරුවන්ගේ - ඔවුන් ආරම්භක පවුල්වල සාමාජිකයන්, කොටස් විශාල වශයෙන් මිල දී ගත් ධනපතියන් හෝ බාහිර ආයෝජකයන් වුවත් - කැමැත්තෙන් ස්වාධීනව ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මන්ඩල තම අභිමතය පරිදි තෝරා ගැනීමටත් තම උරුමක්කාරයන් නම් කිරීමටත් හැකියාව සහිත වූහ. (145 පි.)

23. ඇමරිකානු සංගතයන්ගේ කලමනාකාර ව්‍යූහය දීර්ඝ කාලීන වර්ධනය ඉලක්ක කර ගති. යලි චැන්ලර්ගෙන් උපුටා දක්වතොත්,

> දෙවන ලෝක යුද්ධය හමාර වී බොහෝ කල් ගතවන තෙක් ව්‍යවසායන්හි ඉතා සුලු කොටස් ප්‍රමානයක් පමනක් අත්කරගෙන සිටි විධායක කලමනාකාරයන් (හෙවත් අභ්‍යන්තර අධ්‍යක්ෂකයන්) ද ප්‍රධාන කොටස්කරුවන් ද (හෙවත් බාහිර අධ්‍යක්ෂකවරු) යන දෙගොල්ලම විශ්වාස කලේ, ව්‍යසායන් ඒවායේ සංවිධානාත්මක ධාරිතාවන් මත පදනම්ව තරගකාරී වාසි අත්පත් කරගෙන තිබේ නම් එම ව්‍යවසායේ ම ප්‍රසාරක පහසුකම් උදෙසා ද සේවක මන්ඩල වර්ධනය උදෙසා ද තවතවත් ආයෝජනය යොමුකල යුතුව ඇතැයි යන්න ය. ඔවුන් විශ්වාස කලේ එවන් ආයෝජන අඩු අවදානමක් දරනු ඇති බවත්, ඒ සඳහා ඉහල ප්‍රතිලාභ අනුපාත ලබාගැනීමේ ශක්‍යතාවය වැඩි බවත් ය. එහෙයින්ම ඔව්හු ඉහත වාසිවලින් තොරවූ වෙනත් සමාන්තර කර්මාන්ත අංශවල ආයෝජන කිරීමට පසුබට වූහ. (595 පි.)

24. වත්මන් දේශපාලන තත්වයන් හා සසඳන කල්හි, චැන්ඩ්ලර් විසින් චිත්‍රිත තත්වය පෙන්නුම් කරන්නේ ප්‍රශස්ත තත්වයක් සේ ය. එසේ නම් එය ඇද වැටීමට තුඩුදුන්නේ කුමක් ද? ඓතිහාසික තත්වයන් තුල මුල් බැසගත්තා වූ ද අන්තර් සම්බන්ධිත වූ ද සාධක දෙකක් විශේෂයෙන් ම අර්ථභාරීය. පලමු සහ ඉතා වැදගත් කාරනය නම් ලෝක ආර්ථිකය තුල ඇමරිකා එක්සත් ජනපදයේ තත්වය සමස්තයක් වශයෙන් පරිහානිගත වීම ය. ඇමරිකා එක්සත් ජනපදය 1970 ගනන් දක්වා ම අධිපති ආර්ථික බලවතා ලෙස පැවැතුනේ වී නමුත්, 1950 ගනන් හා 1960 ගනන් පුරා එය යුරෝපයේ හා ජපානයේ ප්‍රතිමල්ල ධනේශ්වර බලවතුන් ඉදිරියේ පසුබෑමට ලක් විය. දෙවනුව, ඇමරිකා එක්සත් ජනපදයේ මහා කොම්පැනිවල ව්‍යූහයේ සහ ආයෝජන මූලෝපායන්හි වෙනස ඉතා සමීපව ලාභානුපාතිකය පිරිහීයාමත් සමග බැඳී පැවැතුනි. එය (ලාභානුපාතිකය) 1960 ගනන් හා 1970 ගනන්වල පශ්චාත් දෙවන ලෝක යුද්ධ උත්පාතයේ දී පවා ගෝලීය පරිමාවක් අත් පත් කරගත්තේ ය.

25. එක් අධ්‍යයනයකට අනුව දියුනු ධනේශ්වර රටවල 1968 සහ 1973 අතර වානිජ හා කාර්මික අංශවල ලාභානුපාතිකය පහෙන් එකකින් (සියයට 20කින්) පහත වැටුනි. (Capitalism since 1945 - ෆිලිප්ස් ආම්ස්ට්‍රෝං, ඇන්ඩෲ ග්ලින් සහ ජෝන් හැරිසන්, ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් : බැසිල් බ්ලැක්වේල්, 1994, 182 පි.) බොහෝ සාධක මෙම සන්තතියට පොහොර දැමූ අතර, ඉන් වඩාත්ම වැදගත් සාධකය වූයේ දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ සිදු වූ දැවැන්ත ප්‍රාග්ධන සමුච්චය යි. විශේෂයෙන් ම ජර්මනිය සහ ජපානය සම්බන්ධයෙන් ගතහොත් එම රටවල පැරනි කාර්මික පොදු කාර්ය පිරිවැය යුද්ධය විසින් මුලුමනින් ම විනාශකරනු ලැබ තිබීම නිසා, අලුතින්ම කර්මාන්ත ගොඩනගා ගැනීමට සිදුව තිබුනු තතු තුල, එම රටවලට ඉතාම දියුනු තාක්ෂනය සහ නිෂ්පාදන විධික්‍රමයන් යොදාගැනීමට අවස්ථාව ලැබුනි.

26. 1960 ගනන් වනවිට යුරෝපයේ සහ ජපානයේ වඩාත් තාක්ෂනිකව දියුනු කර්මාන්තවලට ඇමරිකානු වෙලඳපොල ද ඇතුලුව ලෝක වෙලඳපොලේ ඇමරිකන් නිෂ්පාදන සමග සාර්ථකව තරග වැදිය හැකි තත්වයක් උද්ගත විය. 1960 ගනන්වල මැද දී ලෝක පරිමානව ලාභානුපාතිකයන් පහත වැටීම, එක්සත් ජනපදයේ කර්මාන්ත අංශය තව දුරටත් දුර්වල කලේ ය. මෙය ඇමරිකානු සංගතවල මූලෝපායික

දිශාවනතියේ තවත් අර්ථධාරී වෙනස්කම් ඇති කලේ ය. චැන්ඩ්ලර් පෙන්වාදෙන පරිදි, "සංවිධානාත්මක හැකියාවන් නිසා තරඟකාරිත්වයේ වාසි හිමිකරගත් සමාගම් සහිත කර්මාන්තයෙහි සිය ඉපැයීම් ප්‍රති ආයෝජනය කිරීමේ අවස්ථා, උග්‍රවූ තරඟය හමුවේ අඩුවී යාමේ හා ලාභ පහත වැටීමේ තර්ජනය නිසා ඒවායේ කලමනාකාරවරු අලුත් වර්ධන මාර්ග සොයා යන්නට ද නව කලමනාකාර මංපෙත් පාදා ගැනීමට ද උත්සාහ කරන්නට පටන් ගත්තේ ය."(606 පි.)

## ඒකාබද්ධවීම සහ අත්පත් කර ගැනීම, ප්‍රථම රල පහර දෙක

27. ඇමරිකානු සංගතයන් විසින් ආරම්භ කරන ලද මූලෝපායන්ගෙන් එකක් වූයේ ඒකාබද්ධවීම් හා අත්පත් කර ගැනීම් තුලින් විවිධායනය කරා යාම ය. ඇමරිකානු ධනවාදයේ ඉතිහාසය තුල, විශේෂයෙන්ම එහි නූතන සංගත ස්වරූපයේ වර්ධනයේ දී ඒකාබද්ධවීම් හා අත්පත් කර ගැනීම් විශේෂ භූමිකාවක් ඉටුකර තිබේ. 1960 ගනන්වලට පෙර දී ම ඒකාබද්ධකිරීම් හා අත්පත් කර ගැනීම්වල වැදගත් රල පහර දෙකක් සිදුවී තිබුනි. ඉන් පලමු වැන්න සිදුවී තිබුනේ 1873-1895 ප්‍රථම දීර්ඝ කාලීන ලාභ පහත වැටීමේ කාලපරිච්ඡෙදයේ දී ය. එය 1898-1904 අතර තුර දී කූටප්‍රාප්ත විය. මෙය වනාහී ඉතිහාසයේ ''තිරස්''(හරස් අතට) ඒකාබද්ධවීම්වල සමයයි. එ සමයෙහි දී එක් කර්මාන්තයක් තුල වූ තරගකරුවන් දැවැන්ත ඒකාධිකාරී ව්‍යූහයක් තුලට උකහා ගන්නා ලදී. මෙම ප්‍රථම රැල්ල විසින් පැනනංවන ලද ඉතාමත් වැදගත් සංගතය වූයේ කල්යාමේ දී ඇමරිකාවේ වානේ නිෂ්පාදන ධාරිතාවෙන් සියයට 75ක් අතට ගත් ''යූඑස් ස්ටීල්'' නම් සමාගමයි. මෙම වර්ගයේ අනෙකුත් ඒකාබද්ධ කිරීම් අතර ඩූ පොන්ට්, ස්ටෑන්ඩඩ් ඔයිල්, ජෙනරල් ඉලෙක්ට්‍රික්, ඊස්ටමන් කොඩැක් සහ ඇමරිකන් ටුබැකෝ යන ඒකාබද්ධයන් විය. (මර්ජර්ස් අක්විසිෂන්ස් ඇන්ඩ් කෝපරේට් රී ස්ට්‍රක්චරින් - හතර වන මුද්‍රනය, පැට්‍රික් ඒ හෝගන්, 31-33 පිටු.)

28. ඒකාබද්ධකරනයේ දෙවන රැල්ල ආරම්භ වූයේ 1916 සහ 1929 අතරතුර දී ය. මෙය කිහිප ආකාරයකින්ම ප්‍රථම රැල්ලෙන් තීරනාත්මකව වෙනස් විය: ප්‍රථමයෙන් ම, ඒකාබද්ධ කිරීම් වලින් වැඩි කොටසක් ''සිරස්'' (ඉහල සිට පහලට) ආකාරවිය. මෙහිලා ඒකාබද්ධ කරනු ලැබුවේ ප්‍රධාන වශයෙන්ම තරගකාරී සමාගම් නොවේ. එකකින් අනෙකට භාන්ඩ විකිනීම හෝ මිලදී ගැනීම හෝ සම්පාදනය හා පිටට විකිනීම වැනි ''සිරස්'' සම්බන්ධතා පැවැති සමාගම් ය. ''ඇලයිඩ් කෙමිකල්'' ඒකාබද්ධයට එක් වූ සමාගම්, සමාන නිෂ්පාදන සන්තතීන් ද අලෙවි පද්ධතීන් ද ඒකාබද්ධ කිරීම මගින් මූලෝපායික හා තරගකාරී වාසියක් අත් කර ගන්නා ලදී. ඓතිහාසික වශයෙන් ගත් කල්හි ඒකාබද්ධ කිරීම් රැලි දෙක, ඇමරිකානු මහා සංගතයන් පැන නැගීමේ හා ලෝකය තුල අධිපති බවට පත්වීමේ ක්‍රියාවලියේ දී අර්ථධාරී අවස්ථාවන් විය.

## ඒකාබද්ධ කරනයේ හා අත්පත් කර ගැනීම්වල තුන්වන රැල්ල

29. 1965 දී සහ 1969 දී පුපුරා ගිය තුන්වන ඒකාබද්ධ කරන රැල්ල ප්‍රථම දෙ රලයෙන් ම අති මූලික ආකාරයකින් වෙනස් වූයේ ය. එක්සත් ජනපදයේ දුර්වල වී යන තත්වයට ද ලාභානුපාතිකය පහත වැටීමට ද ප්‍රතිචාර ලෙස වර්ධනය කල තුන්වන රැල්ලේ මූලෝපායික අරමුන වූයේ, දුරස්ථ වශයෙන් සම්බන්ධ වූ හෝ කිසිදු සම්බන්ධයක් නැති සමාගම් මිලදී ගැනීම් කරන ඓතිහාසිකව මුල්බැස සිටි ක්ෂේත්‍රය තුල, ආක්‍රමනශීලීව මිල දී ගනිමින් වර්ධනය වී ලාභ ගොඩනගා ගැනීම ය. මෙම නව මූලෝපාය ඇමරිකානු පාලක පන්තියේ ද සංගත කලමනාකාරිත්වයේ ද, ප්‍රධාන අරටු කර්මාන්තවල ලාභදායිත්වය පිලිබඳ ගැඹුරවන්නා වූ අසුබවාදය පිලිබිඹු කලේ ය. එහෙයින් ඇමරිකානු මහ සංගත තුල ඒකාබද්ධවීම් හා අත්පත් කර ගැනීම් පිලිබඳ සලකා බැලීම කේන්ද්‍රීය මාතෘකාවක් බවට පත් විය. මෙවන් ගනුදෙනුවල සංඛ්‍යාව 1965 දී 2000 සිට 1969 දී 6000 දක්වා ඉහල නැංගේ ය. (චැන්ඩ්ලර්, 622 පි.)

30. මෙම උමතුවේ ප්‍රතිඵලයක් වූයේ නව බලගතු වානිජ ව්‍යාපාරයන් වර්ගයක් පැන නැගීම ය: එනම් මහ සංගත මිල දී ගැනීම සහ විකිනීම ය. ඒ වනාහී ''සංගත පාලනය සඳහා වෙලඳපලක්'' බිහිවීම ය. මෙම වෙලඳ පල 1970 ගනන්වල දී අතිශය බලවත් ආකාරයකින් පිම්බී ගියේ ය. මෙම රැල්ලත් සමග අවයෝජනයේ (පිටට විකුනා දැමීමේ) රැල්ලක් ද වර්ධනය විය. මෙය සමන්විත වූයේ තම සංවිධානවල අඩු කාර්යක්ෂමතාවයකින් යුතු අංශ පිටතට විකුනා දැමීම ය. සැහෙන තරම් දුරකට මෙම විකුනා දැමීම් කලින් කරගත් අනුවන අත්පත් කරගැනීම්වලින් අත් මිදීමට ගත් උත්සාහයක් වූයේ ය. කෙසේ වෙතත් එය නව සංසිද්ධියක් වූයේය. 1970 පෙරාතුව අවයෝජන සංසිද්ධිය බොහෝසෙයින්ම දුලබ දෙයක් විය. 1970 ගනන් වල පටන් එය පොදු ව්‍යාපාරික කටයුත්තක් විය. ව්‍යාපාර මිලට ගැනීම හා විකිනීම එක්සත් ජනපදයේ ව්‍යාපාරික කටයුතු වල ප්‍රධාන උපාංගයක් බවට පරිවර්තනය විය.

31. මෙම වර්ධනය ප්‍රථමයෙන් ඇමරිකානු හා පසුව ජාත්‍යන්තර සංගතවල ව්‍යුහය කෙරෙහි ද මූල්‍යය හා කර්මාන්තය අතර සමස්ත සම්බන්ධතාවය කෙරෙහි ද දැවැන්ත බලපෑමක් ඇතිකිරීමට නියමිතව තිබුනි. නව ආයෝජන ක්‍රමෝපායන් ඇමරිකානු සංගතයන්හි නාටකාකාර ප්‍රතිසංස්කරනයකට තුඩු දුන්නේය. 1960 මැද භාගයට පෙරාතුව සම්මතයක් බවට පත්ව තිබූ සුරැකුම්වල කෙරෙන දිගු කාලීන ආයෝජන

කෙටිකාලීන ප්‍රතිලාභ උපරිම කරගැනීමට දැරෙන උත්සාහයේ ක්‍රමෝපායන් මගින් විස්ථාපනය විය. කර්මාන්තයේ කලමනාකරනය හා ඉදිරි සැලසුම් වෝල් වීදියේ මූල්‍ය ගනුදෙනු මගින් මෙහෙයවිය.

32. සත්තකින්ම මූල්‍ය ප්‍රාග්ධනය නියෝජනය කල බැංකු, 20 වන ශතවර්ෂය පුරාම ඇමරිකානු ව්‍යාපාරික අංශය තුල වැදගත් භූමිකාවක් ඉටු කර තිබුනි. එහෙත් චැන්ඩ්ලර් තම ඓතිහාසික අධ්‍යයනයන් තුල ලේඛන සාක්ෂිවලින් ඔප්පු කර ඇති පරිදි එම භූමිකාව ඉටු කරන ලද්දේ දීර්ඝ කාලීන වානිජ මූලෝපායක් තුල ය. එම මූලෝපාය පොදුවේ සම්බන්ධව පැවැත්තේ කර්මාන්තවල විවිධ අංශයන් ඇතුලත තරගකාරී වාසි අත්කර ගැනීම උදෙසා ය. එහෙත් මූල්‍ය කරනයේ භූමිකාව 1960 ගනන්වල මැද වන විට වෙනස්වන්නට පටන් ගත්තේ ය. වෝල් වීදියේ ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සංගතවල පිලිවෙත කෙටිකාලීන නය ලබාගැනීම සඳහා මූල්‍ය ජාවාරම් කරුවන්ගේ ඉල්ලීම ද සමග පෙල ගැසීම ඉක්මනින්ම සිදු කෙරුනි. මෙය ඉටු කරන ලද්දේ කොටස් මිල දී ගැනීම තුලින් ජාවාරම්වල අයිතිය මාරු කිරීම තුලිනි. වෝල්වීදියේ ගනුදෙනු ජාවාරම්වල පරිමාව එන්න එන්නම උග්‍රවන්නාවූ වේගයකින් වැඩී ගියේ ය. 1950 ගනන්වල ආරම්භයේ නිව් යෝර්ක් කොටස් වෙලඳපලේ වාර්ෂිකව වෙලඳුම් වූ කොටස් ප්‍රමානය දල වශයෙන් වසරකට බිලියන 0.5 විය. 1965 වන විට එය වැඩී තිබුනේ බිලියන 1.5ක් දක්වා ය. 1985 වන විට එය බිලියන 27.5 දක්වා නාටකාකාර ලෙස ඉහල නැගුනි. 2006 දී සමස්ත කොටස් ප්‍රමානය වාර්ෂිකව බිලියන 625ක් දක්වා ඉහල ගියේ ය. මෙම සන්තතිය සමග බැඳී පැවති කරුනක් නම් ආයෝජන බැංකු ඇමරිකානු සංගත ප්‍රතිසංවිධානය කිරීම තුල ඉටු කල කේන්ද්‍රීය ක්‍රියා කලාපයයි. චැන්ඩ්ලර් මෙසේ ලිවී ය, ''1960 ගනන්වල අත්පත් කර ගැනීමේ රැල්ලට පෙර කිසිදු ආයෝජන බැංකු සමාගමකට ඒකාබද්ධකරන හෝ අත්පත් කර ගැනීමේ විශේෂ අංශ පැවතුනේය යි කිව නොහැකිය. එහෙත් වැඩි කල් ගතවන්නට පෙර මෙවන් විශේෂ අංශ බැංකුවලට වැඩිම ආදායමක් ගෙන දෙන අංශ බවට පත් විය.'' (ස්ට්‍රැටජි ඇන්ඩ් ස්ට්‍රක්චර්: චැප්ටර්ස් ඉන් ද හිස්ටරි ඔෆ් ඇමරිකන් ඉන්ඩස්ට්‍රියල් එන්ටර්ප්‍රයිස් (කේම්බ්‍රිජ්, මැසචුසෙට්ස්, ද එම්අයිටී ප්‍රෙස් 1990) හැඳින්වීම, vi පිටුව)

## ඒකාබද්ධකරනයේ හා අත්පත් කර ගැනීම්වල ''සිවුවන රැල්ල

33. 1984 සහ 1989 දී සිදුවූ සිවුවන ඒකාබද්ධකරනය හා අත්පත් කර ගැනීමේ රැල්ලේ දී ඇමරිකානු හා (පසුව ජාත්‍යන්තර) ව්‍යාපාර තුල දී කොටස් වෙලඳපල දැරූ අර්ථභාරය විශේෂයෙන්ම පැහැදිලි විය. නව මූල්‍යකරනය විසින් දුවවනු ලබන සංගත වල සාරභූත වශයෙන් පරපුටු වූ ද, විනාශකාරී වූ ද අපරාධකාරී වූ ද විධිය පැහැදිලිව තහවුරු කරනු ලැබුවේ මෙම කාල පරිච්ඡේදය තුල ය. ආයෝජන බැංකුකරුවෝ මෙම සන්තතිය තුල කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කලහ. පැට්‍රික් හෝගන් පෙන්නුම් කර දෙන පරිදි ඒකාබද්ධකිරීම් , ''ආයෝජන බැංකුකරුවන්ට ඇත්තටම කිසිදු අවදානමකින් තොර වූ උපදේශක ගාස්තු ලබාගැනීම සඳහා යෝධ උල්පතක් වූයේ ය. ආයෝජන බැංකු හා නීති උපදේශක සමාගම් යන දෙකෙහි ම විශේෂඥයෝ මිලදී පවරාගැනීම් පහසු කිරීම හා වැලැක්වීම යන දෙකම අරමුනු කර ගත් බොහෝ නවීකාරක ක්‍රමවේද හා තාක්ෂනය වර්ධනය කලෝ ය.'' (මර්ජර්ස්, ඇක්විසිෂන්ස් ඇන්ඩ් කෝපරේට් රිස්ට්‍රක්චර්, 57 පිටුව.) ආයෝජන බැංකුකරුවන්ගේ මෙහෙයවීම යටතේ ''සතුරු අත්පත් කර ගැනීම'' - මෙය ඇමරිකානු ධනවාදයේ ඉතිහාසයට මුලුමනින්ම අලුත් දෙයක් නොවූයේ නමුත් - පෙර නුවූ විරූ හා කම්පාකාරී පරිමානයක් දැරීය. ඒකාබද්ධ කරනයන්හි සතරවන රැල්ලේ තවත් වැදගත් ලක්ෂනයක් වූයේ ඒවායේ මූල්‍යමය පරිමාවයි. ඩොලර් මිලියන සියය ඉක්මවූ ගනුදෙනු 1974 සහ 1986 අතර තුර 23 ගුනයකට වැඩි තරමකට ඉහල නැංගේ ය. (එම 54 පිටුව) 1980 ගනන්වල ''පසමිතුරු පවරා ගැනීම්'' මූල්‍ය පරපුටුබවේ පුද්ගලාරෝපනය ම යයි කිව හැකි දෙයෙහි විජයග්‍රහනය සලකුනු කලේ ය. තම ප්‍රධාන ආදායම් මාර්ගය පවරාගැනීම් සඳහා ප්‍රයත්නය බවට පත් කර ගත් කෝපරේට් රේඩර් (සංගත කොල්ලකන්නා) මෙහි මුල් තැන ගති. එම තතු තුල පොහොසත් වී ගැනීම රැඳී පැවැත්තේ ප්‍රයත්නයේ සාර්ථකත්වය මත හෝ එවන් අත්පත් කර ගැනීමකින් පසු සමාගමේ ලාභශක්‍යතාවය මත හෝ නොවේ එම පවරා ගැනීම් ප්‍රයත්නයේ දී ම අත්පත් කර ගත් ආදායම මතයි.

## නය පිට මිලට ගැනුම් හා ''නයෙහි වෙලෙන්දෝ

34. සිවුවන රැල්ලේදී ඒකාබද්ධකරනයන් සඳහා මුදල් සම්පාදනය කරන ලද්දේ දැවැන්ත නය කන්දරාවක් මගිනි. මෙම විෂය පිලිබඳ එක් විශේෂඥයෙක් පැහැදිලි කල පරිදි:

> "අත්පත් කර ගැනීම් හා ඒකාබද්ධකරනයේ' සිවුවන රැල්ලේ දී වානිජ ප්‍රජාවේ ශබ්දකෝෂයට ඇතුලුවූ තවත් පදයක් නම් ලීවරේජ්ඩ් බයි අවුට්, එල්බීඕ හෙවත් උත්තෝලික - (දිගු නය පොල්ලක් මගින් ඉටුකරන ලද ) මිලට ගැනීම් ය. එල්බීඕ සංකල්පය ජනප්‍රිය කරන ලද්දේ කොල්බර්ග් ක්‍රැවිස් සමාගම විසිනි. ඔහු එසේ කලේ පූර්න ධාරිතාව සපුරා ක්‍රියාත්මක නොවන්නේ යයි සලකන ලද සංගතයන් මිල දී ගැනීම සඳහා සීමිත කොටස්කාර සමාගම් නිර්මානය කිරීම මගිනි. බොහෝ අවස්ථාවල දී අත්පත් කර

ගැනීමේ මිලෙන් දහයෙන් පංගුවක් පමනක් තම අරමුදල්වලින් පියවා ලූ කොල්බර්ග් ක්‍රැවිස් ඉතුරු කොටස බැංකු නය සහ ඉහල පොලී සහිත අනකර නිකුත් කිරීම මගින් පියවාලීය.

මෙම බැංකු නය සහ අනකර ඇප වශයෙන් යොදා ගත්තේ (කොල්බර්ග් ක්‍රැවිස් සමාගම අත පැවැති වත්කම් නොව) අත්පත් කර ගැනීමේ ඉලක්කය වූ සමාගමේ විශද හා අවිශද වත්කම් ය. මයිකල් මිල්කන් මෙහෙය වූ ඩෙක්සල් බර්න්හැම් ලොම්බෙයාර් වැනි ආයෝජන බැංකු, උත්තෝලික මිල දී ගැනීම් සඳහා මුදල් සම්පාදනයට ආධාරක වූහ. කෝල්බර්ග් ක්‍රැවිස් තමන් විසින් මිල දී ගනු ලැබූ සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට ද, අවඑලදායී වත්කම් විකුනා ලීමට ද, වියදම් කපන පියවරයන් ගැනීමට ද උදව් කලේ ය. මෙම කාර්යක්ෂමකරනය තහවුරු කර ලීමෙන් පසු, සැලකිය යුතු ලාභයක් අත් කර දෙන මිලකට සමාගම යලිත් විකුනනු ලැබේ.'' (ද ලෙසන්ස් ඔෆ් හිස්ටරි රිලේටඩ් ටු මර්ජර්ස් අන්ඩ් අක්විසිෂන්ස් - බිල් ඩන්කන් විසිනි.)

35. කෝල්බර්ග් ක්‍රැවිස් වැනි සමාගම්වල ක්‍රියාකාරිත්වය හුදෙක් පෞද්ගලික ධන ලෝභයේ ම ප්‍රතිඵලයක් වූයේ නැත. ඒ වෙනුවට, සිදු වූයේ ඇමරිකානු ධනවාදයේ කාර්මික පදනම දිරාපත් වීම, කෝල්බර්ග් ක්‍රෙවිස් හා ඩ්‍රෙක්සල් බර්න්හැම් ලොම්බෙයාර් වැනි ''නය වෙලෙන්දන්'' ගේ කටයුතු තුලින් ප්‍රකාශයක් අත් කර ගැනීමයි. ආර්ථික ක්‍රියාකාරිත්වයේ සෑම දර්ශකයක් විසින් ම පෙන්නුම් කරන ලද පරිදි එක්සත් ජනපදය පදනම් කර ගත් කාර්මික නිෂ්පාදනයේ භූගෝලීය තත්වය පාතාලයට ඇද වැටීම දිගින් දිගට ම සිදුවූ අතර, ඇමරිකානු ධනේශ්වරය ධනය රැස් කර ගත් ප්‍රධානම මාර්ගය මූල්‍ය සමපේක්ෂනය බවට පත් විය. 1980 දී මූල්‍ය සම්පාදන ව්‍යවසාය තුලින් සාක්ෂාත් කර ගත්තේ සංගතවල ලාභ වලින් සියයට 6ක් පමනි. එහෙත් 2005 වන විට මෙම ප්‍රතිශතය ඉහල නංවමින් මූල්‍ය කර්මාන්තය සංගත ලාභ වලින් සියයට 40 අත් කර ගත්තේ ය. දැන් ඉතින් ධනය ජනනය කර ගැනීමේ වේගවත්ම මාර්ගය වූයේ නිෂ්පාදනයේ යෙදීම නොවේ: හැකිතාක් දුරට ඉන් ඈත්ව සිටීම යි. මෙය තවත් සංඛ්‍යා ලේඛනයකින් ද තහවුරු වේ. 1981 සහ 2008 අතර කාල පරිච්ඡෙදයේ දී ඇමරිකානු මූල්‍ය අංශයේ සමස්ත නය, දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 22 සිට සියයට 117 දක්වා ඉහල නැංගේ ය. මුදල් ලබා ගැනීමේ වඩාත්ම විශ්වාසදායී මාධ්‍යය වූයේ කාර්මික නිෂ්පාදනයේ අමාරු හා අඩමාන ක්‍රියාවලිය නොව සමපේක්ෂනය යි.

36. ඒකාබද්ධකරනයේ හා අත්කර ගැනීමේ සිවුවන රැල්ල අවසන් වූයේ 1980 ගනන්වල අග අබලි බැඳුම්කර (ජන්ක් බොන්ඩ්) වෙලඳපොලේ බිඳවැටීමෙන් හා නය සෝලි මධ්‍යයේ ය. බෝස්කි සහ මිල්කන් ගේ ජීවන චරිත අපකීර්තිය, අධිචෝදනා සහ සිර දඬුවම් වලින් අවසන් විය. එක්සත් ජනපද ආර්ථිකය 1990-91 දී හායනයට (පසුබැස්මට) ඇද වැටුනි. ඒ හායනයෙන් යලි ගොඩ ඒම, වෙලඳපල දත්තයන් හි ස්ඵෝටනීය (පුපුරනසුලු) ඉහල යාමකින් ආරම්භවී, ඒකාබද්ධයේ පස්වන දැවැන්ත රැල්ල දියත් කලේය. යලිත් වරක් ඒකාබද්ධකරනය ලාභ ලබාගැනීමේ වේගවත්ම ක්‍රමය බවට පත් විය.

## ඒකාබද්ධයේ හා අත්පත්කර ගැනීමේ ''පස්වන රැල්ල

37. 1992 දී ආරම්භ වී 2008 ලෝක අර්බුදය පුපුරා යන තෙක් ම එක දිගට පැවැති බවක් පෙනී ගියා වූ පස්වන රැල්ලේ විශේෂිත ලක්ෂනයක් වූයේ අත්පත් කර ගැනීම් සඳහා මූල්‍ය සම්පාදනයේ දී මහ සංගත, කොටස් වෙලඳපොල පාවිච්චි කල ආකාරයයි. 1990 ගනන්වල කොටස් වෙලඳපල උත්පාතය තුල සීමා රහිතව පිම්බුනු කොටස් වටිනාකම් විසින් මෙයට හැකියාව ලබාදුනි. යථාර්ථ වශයෙන් ගත හොත් මෙම කාල පරිච්ඡෙදයේ දී සිදු කරන ලද බොහෝ ජාවාරම් ''කාර්යක්ෂමතා'' හා ''සම්පාතික'' (සිනර්ජි- විවිධ සාධක එකතුවීම තුලින් එවායේ ඓක්‍යයට වඩා ඉහල ප්‍රතිඵලයක් ඇති වීම) අත්කර දෙනු ඇතැයි මාධ්‍යයන් විසින් හුවා දක්වනු ලැබුව ද ආයෝජන බැංකු, නීතිඥ සමාගම්, මහා කොටස් හිමිකරුවන් විසින් අපේක්ෂා කරන ලද ක්ෂනික මූල්‍ය වාසිවලට පිටස්තරව වෙනත් සාරගර්භ ආර්ථික යුක්ති යුක්ත භාවයකින් තොර විය. මෙම සමපේක්ෂක ගනුදෙනු බොහොමයක ප්‍රතිඵල විනාශදායී විය. මෙසේ ඒකාබද්ධ කරන ලද සමාගම්වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් අන්තිමේ දී බංකොලොත් විය. 1998 සහ 2001 අතරතුරේදී අත්පත් කර ගැනීම් හා ඒකාබද්ධ කිරීම් මගින් පිහිටුවාගන්නා ලද සමාගම් වල කොටස්කරුවෝ ඩොලර් බිලියන 240 වූ කම්පාකාරී පාඩුවකට (ගෝගන් 63 පිටුව) මුහුන දුන්හ. තවත් මෙවන් ජාවාරම් 87කින් ඒවා අත් කර ගත් කොටස්කරුවන්ට ඩොලර් එක් බිලියනයක් හෝ ඊට වැඩි ප්‍රමානයක් බැගින් පාඩු සිද්ධ කලේ ය. (64 පි.)

38. පස්වන ඒකාබද්ධ රැල්ල තවත් අංශයකින් වැදගත් විය. එය නම් එහි ජාත්‍යන්තර පරිමාවයි. එක්සත් ජනපදයේ සිදුවී ටික කලකට පසු ඇරඹුනත්, 1999 වන විට යුරෝපීය ගනුදෙනුවල අගය ඇමරිකානු ජාවාරම් තරමට ම ඉහල නැගුනි. මෙම රැල්ලට ආසියාව ද සැලකිය යුතු ආකාරයකින් ඇදී ගියේ ය. 2001-2002 වෙලඳපොල සංකෝචනය වීමට පසු මෙම රැල්ලේ වේගය තරමක් අඩු වී ගියත්, එය නව ශතවර්ෂය තුලට ද කාවැදුනි. ගෝගන්ට අනුව ''මෙම එම්ඇන්ඩ්ඒ (ඒකාබද්ධකරන හා අත්පත් කරගැනීම) ජාවාරම් යලිත් වරක් පන ගැන්වී සැබැවින්ම භූගෝල පරිමාන ඒවා

බවට පත්විය. විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපයේ ආසියාවේ හා මධ්‍යම හා දකුනු ඇමරිකාවේ පුද්ගලිකරන වැඩිවීම නිසා නව විභව ඉලක්ක හා ඉල්ලුම්කරුවෝ වෙලඳපොලට අවතීර්න වූහ.''(68 පි.)

39. මෙම සමාලෝචනය පෙන්නුම් කර ඇති පරිදි, මෙම ඒකාබද්ධකාරක රැලිවල ඉතිහාසය ඇමරිකානු ධනවාදයේ නැගීම හා බැසීම පෙන්නුම් කරයි. ප්‍රථම රැලි දෙක (1898-1904 හා 1916-1929) ඇමරිකානු ධනවාදය ගෝලීය අධිපති තත්වයට නැගීමේ එක් අංශයක් විය. තුන් වැන්න (1965-69) පැන නැංගේ ලාභානුපාතික පහත වැටීමට හා ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වය පිරිහී යාමේ ආරම්භක ප්‍රකාශනයන්ට ප්‍රතිචාර වශයෙනි. හතරවන (1984-89) සහ පස්වන (1992-2008) රැලි වනාහි පිරිහීම, දිරාපත්වීම සහ ආන්තික පරපුටු බවේ සමාජ ආර්ථික ප්‍රපංචයන් විය. අවසාන රැලි දුවවන ලද්දේ දැවැන්ත නය මගිනි. නයේ වර්ධනය නිෂ්පාදන බලවේග විනාශ කිරීම ද ඉල්ලා සිටියේ ය. මෙම ජාවාරම්වල සාරභූත අරමුන වී ඇත්තේ ආයෝජකයන්ගේ ලාභ හා පුද්ගල ධන සමුච්චය අරමුනු කොට සමාජ ධනය විනාශ කර දැමීම ය. තම ට්‍රිලියන් ඩොලර් මෙල්ට් ඩවුන් නම් කෘතියේ දී චාර්ල්ස් ආර් මොරිස් මෙම සන්තතිය මැනැවින් විස්තර කරයි. ඔහු ට්‍රැවල් පෝර්ට් නම් අන්තර්ජාලය පදනම් කර ගත් 'රිසවේශන්ස්' සමාගමක කතන්දරය විස්තර කරයි. එය බ්ලැක්ස්ටෝන් පුද්ගලික කොටස් ආයෝජක සමාගම විසින් ද වඩාත් කුඩා හවුල්කරුවෙකු විසින් ද මිල දී ගන්නා ලදී.

> "..ඔවුන් තමන්ගේ ම මුදල්වලින් ඩොලර් එක් බිලියනයක් ගෙවූ අතර ට්‍රැවල්පෝර්ට් සමාගමේ ශේෂපත්‍රය ඇප කොට තවත් අමතර ඩොලර් 3.3ක් ලබාගෙන මිල දී ගැනීම සම්පූර්න කලේ ය. ඔවුහු ට්‍රැවල්පෝර්ට් සමාගමට සිදුවූවාක් සේ නිසැකව ම ආයෝජන බැංකුවට විශාල ගාස්තුවක් ගෙවා දැමීය. මාස හතකට පසු ඔව්හු කම්කරුවන් 841ක් දොට්ට දැමූහ. මේ මගින් ඔවුහු එක් කම්කරුවෙකුගෙන්, යුක්තිසහගත අනුමානයක් ලෙස ඩොලර් 125000 බැගින් (පඩිනඩි, පහසුකම්, ඉඩකඩ, ටෙලිෆෝන් යනාදී වශයෙන්) වසරකට ඩොලර් මිලියන සියයකට අධික මුදලක් ඉතිරිකර ගත්හ..
>
> ඉක්බිති කොටස්කරුවන් දෙන්නා ට්‍රැවල්පෝර්ට් ගිනුමෙන් තවත් ඩොලර් බිලියන 1.1ක් නයට ගෙන එම මුදල තමන්ට ම ගෙවා ගත්හ. ඒ තම දුෂ්කර කාර්යයට ගාස්තු වශයෙන් විය යුතු ය. මාස හතක් ඇතුලත දී ඔවුහු තමන් ගේ ඩොලර් බිලියන එකක ආයෝජනය ද අමතර මුදලක් ද ආපසු ලබා ගත්හ. ඉහත කී බැංකු ගාස්තු සහ වාර්ෂික කලමනාකාර ගාස්තු මීට අමතරව ය. ඒ අතර සමාගම තවමත් ඔවුන් සතුව පවතී. මෙහිදී සැලකිල්ලට ගත යුතු තවත් කරුනක් නම්, කම්කරුවන් දොට්ට දැමීම මගින් ඉතුරු කර ගත් ඩොලර් මිලියන 100, අර බිලියන 1.1 නය ආපසු ගෙවීමේ වාරිකයට ගැලපෙනු ඇතැයි යන්නය. එය ඉතා ලස්සනය - මූල්‍ය සම්පාදකයන්ගේ වචනවලින් කිවහොත්, ''වටිනාකම් නිර්මානය කිරීමකි'' හැබැයි, ඒ සඳහා වෙනත් වචනයක් ද යොදා ගත හැකිය., එනම් ''මංකොල්ලය'' යි.
>
> ඇත්ත වශයෙන් බ්ලැක්ස්ටෝන් කර තිබුනේ පවතින වටිනාකම බෙදාගැනීමක් මිස, නව වටිනාකම් නිර්මානයක් නොවේ. (137-38 පිටු.)

## පරපෝෂිතභාවයේ සමාජ හා ආර්ථික විපාකයෝ

40. ඩොලර් බිලියන 7කට වැඩි පුද්ගලික වත්කමක් අතැති සභාපතිවරයෙකු අරක්ගත් බ්ලැක් ස්ටෝන් සමාගමේ වැඩකටයුතු පිලිබඳ මෙම විස්තරය, එම ස්ථරයේ සාරභූත සමාජ අර්ථභාරය කෙරේ අවධානය යොමු කරයි. බ්ලැක්ස්ටෝන් වැනි කල්ලි වල ක්‍රියාකාරිත්වය, සමාජමය වශයෙන් 'අපක්ෂපාතී' (නිෂ්ක්‍රිය) නැත. ඔවුන් යොදාගන්නා, ''කොටස්කරුවන්ගේ වටිනාකම නිර්මානය කිරීම'' යන වාක්‍යාංශය වනාහී, මෘග ලෙසින් සූරාකන්නා වූ ද සමාජිකව විනාශකාරී වූ ද සාරභූතව ම අපරාධකාරී වූ ද මෙම මුදල් ජාවාරම් වසං කිරීම සඳහා යෙදෙන සමාජ ව්‍යාජොක්තියකි. 1980 ගනන්වල ඒකාබද්ධකරනයෝ හා අත්පත් කර ගැනීම් රැල්ලට අවශ්‍යවූ ද, නැතිව සාර්ථක විය නොහැකිවූ ද තත්වය නම් ඇමරිකා එක්සත් ජනපදය තුල කම්කරු පන්තියේ සමාජ තත්වයට එල්ල කරන්නා වූ දැවැන්ත ප්‍රහාරයකි. රීගන් පාලනය විසින් - ඩිමොක්‍රටික් පක්ෂයේ ද සහායෙන් - ක්‍රියාත්මක කරන ලද පිලිවෙත් මහ සංගත කොල්ලකරුවන්ගේ ක්‍රියාන්විතයන් උදෙසා අවශ්‍ය දේශපාලන රාමුව සපයා දුනි. උත්තෝලික මිලදී ගැනීම්වලට බැඳී ඇති දැවැන්ත නය පියවීම සඳහා කම්කරුවන් වඩ වඩාත් උග්‍ර ලෙස සූරා කෑ යුතු විය. එය සිදු කරන ලද්දේ වෘත්තීය සමිති තලා දැමීම, වැටුප් කැපීම, සහන කැපීම, වඩාත් දැඩි වැඩ නීති සහ රැකියා ලක්ෂ ගනනක් අහෝසි කර දැමීමේ ස්වරූපයෙනි.

41. අවාසනාවන්ත අහම්බයන් ලෙස පැහැදිලි කල නොහැකි ආර්ථික ව්‍යසනයන් යලි යලිත් ඇති වීමේ ක්‍රියාවලිය වනාහී, ආයෝජකයන් එතරම් ම කෑදර නුවූවා නම්, විධායක නිලධාරින් වඩාත් වගකිව යුතු ලෙස ක්‍රියා කලේ නම්, පරිපාලකයන් වඩා ඇස් ඇර සිටියා නම් යනාදී වශයෙන් වලක්වා ගත හැකි ඒවා වූයේ නැත. 1980 ගනන්වල සිට අවුරුදු පහෙන් පහට පාහේ ප්‍රධාන පෙලේ ව්‍යසනයක් සිදු වී තිබේ. ඊනියා ''කෑදර

දශකය'' ලෙස හඳුන්වනු ලැබූ 1980 ගනන්වල දී, සේවිංග්ස් සහ ලෝන්ස් (ඉතිරි කිරීම් සහ නය) නමැති ආයතනයේ සෝලිය, ජනක් බොන්ඩ් (අනාරක්ෂිත වුවත් ඉහල ම පොලී සොයා ගිය-අබලි අනකර) උමතුව (අයිවන් බෝස්කි සහ මිචෙල් මිල්කන්) සහ 1987 වෝල් වීදිය බිඳ වැටීම සිදු විය. 1990 ගනන්වල දී මෙක්සිකෝවේ පෙසෝ අර්බුදය, ඩොට් කොම් බුබුල, ආසියානු අර්බුදය රූබල් අර්බුදය සහ ලෝංග් ටර්ම් ඉන්වෙස්ට්මන්ට්, බිඳ වැටීම සිදුවිය. 2001 දී එක් රැයින් මෙන් එන්රොන් සමාගම බිඳ වැටුනි. එහි දී කීර්තිධර ගනකාධිකරන සමාගම් - එන්රොන් සමාගමේ ගනන් හිලව් විකෘති කිරීමේ ලා - හවුල් අපරාධකරුවන් ලෙස ක්‍රියා කර තිබුනු බව එළිදරව් කැරිනි. ඉක්බිති ඇමරිකානු මහ බැංකුව විසින් දශක ගනනාවක් තිස්සේ පොලී අනුපාතික පෙර නුවූ පරිදි පහත මට්ටම්වලට කැපීම තුලින් පෝෂනය වූ නිවාස බුබුල බිඳ වැටුනේය. මෙවන් සමපේක්ෂක මෙහෙයුම්වලට යටින් පවත්නේ ඇමරිකානු ධනවාදයේ සැබෑ නිෂ්පාදන පදනම් දිරාපත් වීම ද, පාලක පන්තියේ පොහොසත් වීමේ උත්සුකය ද, නිෂ්පාදන ක්‍රියාවලියෙන් හා සැබෑ වටිනාකම් නිෂ්පාදනයෙන් වියෝවීම ද වේ.

## ඩොලර් ආධිපත්‍යයේ අවසානය

42. ඇමරිකානු ධනවාදයේ ''ස්වර්නමය යුගය'' පිලිබඳ දේව මිථ්‍යාව යලි පන ගැන්වීම මගින් මෙම අර්බුදය ජය ගත නොහැකිය. ප්‍රථමයෙන් ම සැලකිල්ලට ගත යුතු කරුන නම්, ගත වූ වසර 40 ඇතුලත ඇමරිකානු ධනවාදය ලෝක අර්බුදය තුල අත්කරගත් වෛෂයික තත්වය යසරඟට පිරිහී යාම ය. මා මේ වාර්තාවේ කල් තබා පැහැදිලි කල පරිදි 1950 ගනන් තරම් ඈතක සිට ම ඩොලරයේ තත්වය පිරිහී යාම, එක්සත් ජනපදයේ ගෝලීය තත්වය පිරිහී යාම පිලිබඳ මුල්ම සලකුනුවලින් එකක් විය. 1971 දී එක්සත් ජනපදය ඩොලර් රන් පරිවර්ත්‍යතාව අවසන් කර දැමී ය. එහෙත් එක්සත් ජනපදය දැවැන්ත ප්‍රවර්තන වියදම් හිඟයන් අත් කර ගනිමින් ලෝකයේ විශාලතම නයකාර ජාතිය බවට පත් වූ තතු තුල ද, ලෝක සංචිත මුදල ලෙස ඩොලරය රැඳී පැවැතුනි. එහෙත් මෙම අර්බුදය තවත් ඓතිහාසික සන්ධිස්ථානයකට එලඹ ඇති බව පෙන්වමින් චීන අගමැති වෙන් ජියාබාවෝ, ඇමරිකානු ඩොලරයේ අනාගත ශක්‍යතාවය පිලිබඳව ද එහෙයින්, චීනය අත පවත්නා ඩොලර් සංචිතවල අගය බිඳ වැටීම ද පිලිබඳ බියසැක ප්‍රසිද්ධියේ ම පලකර තිබුනේ මෙසේ යː ''අපි එක්සත් ජනපදයට විශාල මුදලක් නයට දී ඇත්තෙමු. සත්තකින්ම අපි අපගේ මේ වත්කම්වල සුරක්ෂිතතාව පිලිබඳ කනස්සල්ලෙන් සිටිමු. අවංකව කිවහොත්, මම සැලකිය යුතු තරමක තැවුලට පත්ව සිටිමි.''

43. ප්‍රමුඛ ආර්ථික බලවතකු - ඇමරිකානු ඩොලර් විශාලතම සංචිතයක් අත තිබෙන විදේශික රට - විසින් එක්සත් ජනපදයේ මූල්‍ය ශක්‍යතාව ප්‍රශ්නයට භාජන කොට තිබේ. බොහෝ ඇමරිකානු ආර්ථික අර්ථකථකයන් ඩොලරයේ එබඳු බිඳ දැමීමක් මගින් ගෝලීය මූල්‍ය සහක්‍රියාකාරිත්වයට ඇතිවන ආර්ථික විපාකවලට, චීනය ද බිය වන බව ගෙන හැර දක්වමින් වෙන්ගේ ප්‍රකාශය එතරම් ගනන් ගෙන නැති බවක් පෙනීයන නමුත්, වෙන්ගේ මෙම ප්‍රකාශයේ අර්ථභාරය කොතරම් අවධාරනය කලත් නොසෑහේ. මේ වන තෙක් ඩොලරයේ ගෝලීය භූමිකාව ඇමරිකා එක්සත් ජනපදයට අති විශේෂ මූල්‍යමය වාසියක් අත් කර දී තිබුනි. එක්සත් ජනපදය ලෝක සංචිත මුදල ලෙස කටයුතු කරමින්, මුදල් අච්චු ගැසීම පාලනය කරන්නා ලෙස පැවැතී ඇත.

44. ඩොලරයට එහි සුවිශේෂ ගෝලීය තත්වය නැතිව ගිය හොත්, ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වයට පමනක් නොව එරට දේශීය පිලිවෙත් පිලිබඳව ද ඇතිවන විපාක ක්ෂනික වනු ඇත. ඔබාමා පාලනාධිකාරයේ ඩොලර් ට්‍රිලියන ගනනක් මුදල් අච්චුගැසීම මත පදනම්ව ඇති සමස්ත උත්තේජක පැකේජය ම, එක්සත් ජනපදයේ නයකාරයන් ඩොලර්වලින් තම වත්කම් තබා ගැනීමට කැමතිවීම මත රැඳී පවත්නේ ය යන්න පෙන්වා දීම පමනක් වුව ද සෑහේ.

## පද්ධතිමය අර්බුදයක්

45. මෙම දේශනය විසින් ඉදිරිපත් කර ඇති විශ්ලේෂනය වන්නේ, වත්මන් අර්බුදය අනුසන්ධිමය දෙයක් නොව පද්ධතිමය අර්බුදයක් බවයි. එය පැනනැගී ඇත්තේ ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වය දිගුකාලීන වශයෙන් පිරිහී යාම මත බවයි. ව්‍යසනකාරීව පැතිර ගිය නයෙන් පෝෂිත මූල්‍ය සමපේක්ෂනය වනාහී අර්බුදයේ නිධානය නොවේ. එය වනාහී ඇමරිකානු හා ගෝලීය ආර්ථිකයේ ගැඹුරට මුල් විහිදුනු ප්‍රතිසතිතාවන්ගේ විපාකය යි. අප මෙහි දී පැහැදිලි කිරීමට උත්සාහ කර ඇති පරිදි අවුරුදු 40කට පෙර ඇමරිකා එක්සත් ජනපදය මුහුන දුන්නා වූ ආර්ථික පීඩනයන්ට එරෙහිව එරට විසින් ගනු ලැබ ඇති එම පියවරයන් ම දැන්, ඒ රට මුහුන දී ඇති අර්බුදයට පදනම දමා තිබේ.

46. වත්මන් අර්බුදයට යටින් පවත්නා ප්‍රතිසතිතාවන්හි ඓතිහාසික හා ගෝලීය ස්වභාවය නිසා ම, වත්මන් පහත වැටීම- කිසියම් කාල රාමුවක් ඇතුලත පලල් ජනතාවගේ ජීවන තත්වයන්ගේ නව කල් පවත්නා සංවර්ධනයකට තුඩුදෙන - ආර්ථික වර්ධනයකට ඉඩ දී ඉවත් වී යතැයි කෙරෙන ඔබාමා පාලනයේ කියා පෑම් කල් නොයවා ම සිද්ධීන් විසින් නිෂ්ප්‍රභා කෙරෙනු ඇත. ආර්ථික අනුසන්ධිය මසින් මසට හා කාර්තුවෙන් කාර්තුවට උච්චාවචනය වීම

නොතකා ම, අර්බුදය තුල ස්ථිරව ම දිගට පවත්නා බලපෑම වනු ඇත්තේ, එක්සත් ජනපද කම්කරු පන්තියේ ජීවන තත්වයන්හි වේදනාකාරී හා දිගු කල් පවත්නාවූ බරපතල වැටීමක් ඇති කරන්නේය යන්නයි.

47. එපමනක් නොව, ඉතිහාසයෙන් අපට උගතහැකි ප්‍රධාන පාඩමක් ඇත්තේ නම් ඒ, ධනවාදයේ ජාත්‍යන්තර පද්ධතිමය බිඳ වැටීමක් අනිවාරනීයව ම ප්‍රචන්ඩ දේශපාලන කම්පනයන්ට මග පාදන බවයි. අර්බුදයට පත් ධනවාදය දේශපාලන ඒකාධිපතිත්වයන්ට හා වියරු යුදවාදයට සරු කෙතක් වෙයි. 1930ස් ගනන්වල මූල ආර්ථික බිඳ වැටීම තුලින්, ප්‍රථමයෙන් ෆැසිස්ට්වාදය ද ඉක්බිති ලෝක යුද්ධය ද පැන නැගුනි. දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ ධනවාදය යලි ස්ථාවර කරනු ලැබුවේ කෝටි සංඛ්‍යාත ජනකායකගේ ලේ වලිනි.

## ඇමරිකානු පාලක පන්තියේ සමාජ දේහකාය

48. දරන හරින අර්බුදයේ ගැබ්ව ඇති භයංකර විපාක වටහා ගැනීම භීතිවාදය නොව දේශපාලන යථාර්ථයයි. පාලක පන්තීන් ධනවාදයේ සිදුවෙමින් පවත්නා බිඳ වැටීමට 21 වන සියවසේ ප්‍රථම හා දෙවන දශක තුල දක්වන්නට යන ප්‍රතිචාරය, ඔවුන් එවන් තත්වයකට 1930 හා 1940 ගනන්වල දැක්වූවා වූ ප්‍රතිචාරය ට වඩා අඩු මෘගත්වයක් දරනු ඇතැයි විශ්වාස කිරීමට හේතුවක් නැත 21 වන ශතවර්ෂයේ මහ සංගත මූල්‍ය ප්‍රභූවේ සුපිරි ධනවතුන්, තම ආසක්තයන් ආරක්ෂා කර ගැනීමේ දී ගත වූ ශතවර්ෂයේ මහා ධන කුවේරයන් කලාට වඩා අඩු මෘගත්වයක් ප්‍රදර්ශනය කරනු ඇතැයි අපට සිතීමට ඉඩ දෙන මොනයම්මැ හෝ ලක්ෂනයක් වත්මනුන්ගේ සංස්කෘතිය තුල පහලව ඇත්තේ නැත. ධනේශ්වර ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය, එය මුල් බැස ඇත්තා වූ පන්ති සම්බන්ධයන් හා ආසක්තතාවන්ගෙන් කිසියම් අධිභෞතික ආකාරයකට වියුක්ත කොට ගත හැකිවන්නේ නැත. ගතවූ ශතවර්ෂ කාල තුල දී ඇමරිකානු ධනවාදයේ දිරාපත්වීම විසින් දැවැන්ත ධනයකට අධිපති වන්නා වූ බලගතු සමාජ ස්ථරයක් නිර්මානය කර ඇති අතර එම ස්ථරයේ සමාජ හා දේශපාලන ආක්‍රමනශීලීත්වය, එහි ආර්ථික පරපෝෂිත බව විසින් උග්‍ර කරනු ලැබ පවතී. එහි පිලිවෙත් මගින් ම ඇති කරනු ලැබූ බංකොලොත් බව හා බිඳ වැටීම් කෙරේ එය දක්වා ඇත්තා වූ ආරම්භක ප්‍රතිචාරයන් තුලින් අපට එලඹිය හැකි නිගමනය වන්නේ, පාලක පන්තිය අර්බුදයේ බර මහා ජනතාවගේ කර පිටින් යැවීමට අධිෂ්ඨාන කරගෙන සිටින බවය.

49. ආර්ථික අර්බුදයට ඇමරිකා එක්සත් ජනපදයේ පාලක ප්‍රභූවේ ප්‍රතිචාරය නිරීක්ෂනය කරන කල්හි, අපට සඳහන් නොකර බැරි කරුනක් නම්, 1789 දී පුපුරාගිය විප්ලවය මුවවිට දී ප්‍රන්ස රදල පන්තිය දැක්වූ ප්‍රතිචාරයට එහි ඇති සමාන භාවයයි. ප්‍රන්සය මුහුන දුන් මූල්‍ය අර්බුදයට තර්කාන්විත විසඳීමක් සොයා ගැනීමට දරන ලද සෑම ප්‍රයත්නයක්ම ප්‍රන්ස රදල පන්තිය විසින් වලක්වා ලන ලද්දේ, අර්බුදය තමන්ගේ ම ආසක්තයන් උදෙසා යොදාගැනීමේ අධිෂ්ඨානයෙනි. වංසක්කාරයෝ තමන්ගේ ම ධනය, තත්වය සහ වරප්‍රසාදවලට තර්ජනය කරන කුමන පියවරයක් හෝ නො ඉවසූහ. අන්තිමේදී ඔවුන්ගේ දරදඬුභාවය සමාජයේ අති මහත් බහුතරය වූ ''තුන්වන පෙලැන්තිය,'' පෙර නොවූ විරු පෙරලිකාරී පියවර ගැනීම දෙසට තල්ලු කර දැමීය.

50. අසාර්ථක වූ බැංකු සහ මහා සංගතයන්හි විධායකයන් ඩොලර් කෝටි ගනන් බෝනස් දීමනා තමන්ට ම තෑගි කර ගනිමින් මහජන මතය කෙරේ දක්වන තුච්ඡ පිලිකුල, ඇමරිකානු පාලක පන්තියේ වෙනස් කල නොහැකි ප්‍රතිගාමී සහ සමාජමය වශයෙන් විනාශකාරී වූ ස්වභාවය එලිදරව් කරයි. මහ සංගත ප්‍රභූව තමන්ගේ ධනය හා වරප්‍රසාද තර කර රැක ගැනීම සඳහා ඕනෑම තුච්ඡ පියවරක් ගනු ඇත. වරප්‍රසාදවලින් මතුවූ පාලක පන්තියක්, සදාචාර රීති පසෙක තිබියේවා, අඩු ගනනේ නීතිමය සීමාවන් ද නොතකා තමන්ට උවමනා දෙයක් කල හැකි යයි විශ්වාස කරන බව ඒඅයිජී (දැවැන්ත රක්ෂන සමාගම) සිද්ධියෙන් එලිදරව් විය. ජනාධිපති ඔබාමාගේ භාන්ඩාගාර ලේකම් ටිම් ගෙයිත්නර්, (මොහු ඔබාමා පාලනාධිකාරියේ සෙසු සාමාජිකයන් බොහෝ දෙනෙකු මෙන් ම බහු කෝටිපතියෙකි.) කිසිදු නීතිමය හෝ වෘත්තීමය දඬුවමක් නොලැබ බදු වංචාවක් සිදුකර ඇත. අපට වරක් මහා දේපල ජාවාරම් කරුවෙකු කී පරිදි බදු ගෙවීම වනාහී, ''පුංචි මිනිසුන්ගේ වගකීමක් පමනි.''

51. ඇමරිකානු පාලක පන්තිය ජරපත් රදල පෙලැන්තියක ගතිගුන අත්පත් කරගෙන පවත්නා තරම සිත් කාවදී. ස්වයං-ග්‍රස්ත (තමන්ගැනම පමනක් සිතන) ස්වයං මෝහිත (තම රූපයට ම - ග්‍රීක ජන ප්‍රවාදයක එන නාර්සියස් කුමරු මෙන් - මෝහනය වූ) ඇමරිකානු පාලක ප්‍රභූව ජීවත් වීම සඳහා කඹුරන්නට සිදුවී තිබෙන සමාජයේ එම කොට්ඨාසයේ හැඟීම් කිසිසේත්ම නොතකන්නා වූ තත්වයකට පත්ව ඇත. ඒඅයිජී සෝලිය මැද්දැවේ දී නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පතේ එක් ප්‍රධාන වානිජ ලිපි සම්පාදකයෙක් වූ ඇන්ඩෘ රොස් සෝකින්, ඩොලර් හැට මිලියනයක් බෝනස් ඒඅයිජීයට ගෙවිය යුතුව ඇත්තේ කොන්ත්‍රාත්තු ගිවිසුම්වල ශුද්ධත්වය ආරක්ෂා කර ගැනීමට යයි තර්ක කලේ ය. එහෙත් එම ලේඛකයාම, මෝටර් කම්කරුවන් හා හාම්පුතුන් අතර කලින් අත්සන් කල සාමූහික ගිවිසුම ඉරා දැමිය යුතු යයි ද සහන අහෝසි කල යුතු යයි ද වැටුප් පහත දැමිය යුතු යයි ද තර්ක කරයි. මෙහි දී පෙනී යන අයුරු

නීතිමය ප්‍රමිතීන් තීර්නය කරනු ලබන්නේ පන්ති අවශ්‍යතා අනුවය.

## ඔබාමා පාලනාධිකාරයේ පිලිවෙත්

52. ඉදිරි මාස කිහිපය තුල දී සිද්ධීන් ගතහැකි ගමන් මග කුමක්දැයි සලකාබැලීමේ දී අප පහත සඳහන් කාරනය සිත තබා ගත යුතුය. ඔබාමා පාලනාධිකාරයේ පිලිවෙත් තීර්නය කරනු ලබන්නේ සංගත හා මූල්‍ය වංශාධිපතිත්වයේ ආසක්තතා විසින් ය. මේ අර්ථයෙන් ගත් කල්හි ඔබාමා රූස්වෙල්ට්ට සමාන කරන්නෝ, මහජනයා රවටීමේ හෝ තමන්ම රවටීගැනීමේ යෙදී සිටිති. එකල පැවති දැවැන්ත ආර්ථික අර්බුදය මැද දී වුව, 1930ස් ගනන් වන විට ඇමරිකා එක්සත් ජනපදය සතුව පැවැති යෝධ ආර්ථික සම්පත්, සමාජ ප්‍රතිසංස්කරන අත්හදාබැලීමේ ඉඩකඩ රූස්වෙල්ට්ට සලසා දුන්නේ ය. වර්තමාන ඇමරිකානු ධනවවාදය අත එවන් සම්පත් ඇත්තේ නැත.

53. කෙසේවුව ද, ඉදිරි මාස ගනනාව තුල සිද්ධීන්ගේ ගමන් මග කොයි අත ගැනීමට ඉඩ තිබේදැයි සැලකීමේ දී, 1930 ගනන්වල සිද්ධීන් අතුරෙන් එක් අර්ථභාරී කාරනයක් සැලකිල්ලට ගත යුතු ය. රූස්වෙල්ට් පාලනයේ ප්‍රථම ''දින 100'' පිලිවෙත් ආරම්භකත්වයන් බර තොගයක් සහිතව වුවත්, ආන්ඩුවේ පිලිවෙතේ අර්ථභාරී වෙනසක් පෙන්නුම් කලේ ය යන්න ගැන සැකයක් නැත. එහෙත් ඇමරිකානු සමාජය තුල රැඩිකල් වෙනසකට තල්ලුව ආවේ උඩින් නොව, රූස්වෙල්ට්ගෙන් නොව, යටිනි., එනම් වඩ වඩාත් උග්‍රවන්නා වූ සටන්කාමයෙන් හා නිර්භීත බවින් යුතුව, වැඩේ තමන් අතට ගත් ඇමරිකානු කම්කරු පන්තියේ මහත් බහුතරයෙනි. ඇමරිකාවේ සමාජ තත්වයන්හි සැබෑ අර්ථභාරී වෙනස්කම් වලට තුඩු දුන්නේ, 1934 ටොලෙඩෝ, සැන්ෆ්‍රැන්සිස්කෝ සහ මිනිය පොලිස් අලලා ගිය මහා වැඩ වර්ජන ද, 1935 අමරිකානු කාර්මික සංවිධානවල කොංග්‍රසයේ (සීඅයිඕ) ආරම්භක සම්මේලනය ද, 1936-37 මහා සිට් ඩවුන් (වාඩි ලා ගැනීම්) ස්ට්‍රයික් රැල්ල ද යනාදියයි.

## අර්බුදය හා පන්ති බලවේග

54. ඓතිහාසික වශයෙන් අර්ථභාරී අර්බුදයක වඩාත්ම සාරභූත ලක්ෂනය වන්නේ, එහි බලපෑමට හසුවන රටෙහි (හෝ රටවල) ප්‍රමුඛ පන්ති බලවේගයන්ට, අර්බුදය සම්බන්ධව ස්වාධීන ආස්ථානය සකස් කර ගෙන එහි පිහිටා සිටීමට සිදු කිරීම ය. වෙනත් වචන වලින් කිවහොත් තමන්ගේ ම සමාජ අවශ්‍යතා හා ආසක්තයන් ප්‍රකාශිත කෙරෙන විසඳුමක් අර්බුදය පිලිබඳව ඉදිරිපත් කිරීමට ඔවුන් තල්ලු වන බවය. පාලක පන්තිය මෙම සන්තතිය ක්‍රියාත්මක කරන්නේ ස්වාභාවිකව ම ය. (ඉබේටම ය.) ඔවුන් පිලිගන්නේ තනිකරම තමන්ගේ දේශපාලන හා ආර්ථික ආසක්තයන් පමනක් යම්කිසි වැදගත්කමක් දරන බවය. මේ අනුව වත්මන් තත්වය තුල දී ඔබාමා පාලනාධිකාරයේ (සිය පූර්වප්‍රාප්තිකයා (බුෂ්) ගේ පටන් ''සුමුදු සංක්‍රමනයක්'' සම්පූර්න කරගෙන සිටින) ප්‍රමුඛ කටයුත්ත වන්නේ බැංකුවලට මුක්කු ගැසීම බවත්, මහ සංගත හා මූල්‍ය වංශාධිපති පෙලැන්තියේ ධනයට හා වරප්‍රසාදයන්ට බාධක වන කුමන පියවරක් හෝ නොගැනීම බවත් නිසැකවම විශ්වාසයට ගෙන සිටී.

55. කම්කරු පන්තියට නම්, අවශ්‍ය ක්‍රියාමාර්ගය හා පිලිවෙත් සහිතව අර්බුදය කෙරේ ස්වාධීන ආකල්පයක් සූත්‍රගත කර ගැනීම වනාහී, වඩාත් දිග් ගැසුනු සමාජ දේශපාලන සන්තතියක් වන්නේ ය. ජනතාව තම අත්දැකීම් ම හදාරා විග්‍රහ කොට ගෙන තමන්ගේ ම නිගමනයන් කරා එලඹිය යුතුව ඇත. එහෙත් මෙම සන්තතිය දැනටම ඇරඹී තිබේ. මැතිවරන වර්ෂයේ පොරොන්දු ද ආන්ඩුවේ ඇත්ත යථාර්ථය ද අතර අගාධය සෑම දිනකම වඩ වඩාත් ඉස්මතු වෙයි. ක්‍රියාකිරීමේ උවමනාව වඩ වඩාත් හදිසි වන තතු තුල කම්කරු පන්තිය ''වෙනස'' පිලිබඳ තනිකර වාචාල පුහු ආමන්ත්‍රනයන් කෙරේ තම ඉවසීම හමාර කරගනු ඇත.

56. 1847 දී මාක්ස් සහ එංගල්ස් මෙසේ ලියූහ. ''මෙතුවක් කල් පැවති සමාජයන්ගේ ඉතිහාසය වනාහී පන්ති අරගලයේ ඉතිහාසය'' යි. මාක්ස්වාදය නිශ්ප්‍රභාකරනු ලැබුවේ යයි ද සමාජවාදයේ සමානතාවාදී අපේක්ෂාවන් වත්මන් ලෝකයට නොගැලපේ යයි ද යන්නට යටින් පැවත්තේ ''පන්ති අරගලය'' අතීතයට අයත් වූවක් බවය. පන්ති අරගලය අහෝසි වී ඇතැයි නිල නිගමනය කරා එලඹෙනු ලැබුනේ, පාලක පන්තිය තම පන්ති අවශ්‍යතාවන් නිර්දය ලෙස තහවුරු කර ගැනීමට ක්‍රියාත්මක වෙමින් සිටියා වූ ද, සිටින්නා වූ ද තතු තුල වීම උත්ප්‍රාසාත්මක ය.

57. නිසැකව ම ආර්ථික අර්බුදය පිලිබඳ සාධනීය එක් තනි කාරනය වන්නේ, එය නූතන ධනේශ්වර සමාජයේ සැබෑ සමාජ සම්බන්ධතා එලිදරව් කර ලීම ය; කම්කරු පන්තිය සහ ධනේශ්වර වංශාධිපතිත්වය අතර පවත්නා අශමනීය වූ ආසක්තතා සට්ටනයකට ඇද දැමීම ය; එහෙයින් කම්කරු පන්තිය යලි ඉස්මත්තට ඒමට ද 1930ස් ගනන්වල පන්ති අරගලයන් ඉක්මවා යන්නා වූ පරිමානයක විවෘත පන්ති අරගල ආරම්භ වීමට ද නියමිතව තිබේ. ඇමරිකානු කම්කරු පන්තිය විප්ලවවාදී අරගලයේ ජාත්‍යාන්තර මහා වේරම්බයට උකහා ගනු ලබමින් පවතී. වත්මන් ලෝක අර්බුදය "ඉතිහාසයේ සම්ප්‍රාප්තියට" වේදිකාව සපයා ඇත්තේ ඒ අයුරිනි